# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,564 - 2008 අගෝස්තු මස 22 වැනි සිකුරාදා - 2008.08.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 944 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 955 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 955 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 967 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 976 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අගෝස්තු මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අගෝස්තු මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 463

D/RF/824/NY/04.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2007 ඔක්තෝබර් මස 20 වැනි දින සිට රියර් අද්මිරාල් වශයෙන්,

කොමදෝරු (තාවකාලික රියර් අද්මිරාල්) දිසානායක විජේසිංහ ආරච්චිලාගේ සෝමතිලක දිසානායක, ඩබ්ලිව්, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0117.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-641

---

2008 අංක 464

D/RF/824/NY/04.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2007 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන්,

කොමදෝරු මොහොප්පු තන්තිරමලාගේ දමයන්ත ජයනෙත් ධර්මසිරිවර්ධන, යූඑස්පී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0150
කොමදෝරු සමරසිංහ ආරච්චිගේ මැක්සිමස් ජයන්ත පෙරේරා, යූඑස්පී, පීඑස්සී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0140

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

08-640

---

2008 අංක 465

D/RF/824/NY/04.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2008 මාර්තු මස 04 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් (සැ) වශයෙන්,

කොමදෝරු (සැ) රංජිත් රෝහණ විජයසුන්දර, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0104.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08-642

---

2008 අංක 466

D/RF/824/NY/04/01

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2007 නොවැම්බර් මස 21 වැනි දින සිට කොමදෝරු වශයෙන් :

කපිතාන් (තාවකාලික කොමදෝරු) පානදුරේ ආරච්චිගේ දොන් රෝහන පෙරේරා, ආර්එස්පී, යූඑස්පී, පීඑස්එන්, ශ්‍රීලංනාහ- එන්ආර්එක්ස් 0179
කපිතාන් (තාවකාලික කොමදෝරු) ගීකියනගේ එඩ්වඩ් ක්‍රිස්ටි ජයවර්ධන ආර්එස්පී, යූඑස්පී, පීඑස්පී, ශ්‍රීලංනාහ-එන්ආර්එක්ස් 0177
කපිතාන් (තාවකාලික කොමදෝරු) අගම්පොඩි චානක රූපසිංහ, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ-එන්ආර්එක්ස් 0182

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

08-633

2008 අංක 467

D/RF/824/NY/04.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2007 ජූනි මස 08 වැනි දින සිට කොමදෝරු වශයෙන්,

කපිතාන් (තාවකාලික කොමදෝරු) රවින්ද්‍ර චන්ද්‍රසිරි විජේගුණරත්න, ඩබ්ලිව්,ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්එන්, එස්එල්එන් - එන්ආර්එක්ස් 0176

කපිතාන් (තාවකාලික කොමදෝරු) ධම්මික ශ්‍රීනාත් උඩවත්ත, ආර්එස්පී, යූඑස්පී, එස්එල්එන් - එන්ආර්එක්ස් 0180

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-639

2008 අංක 468

D/RF/824/NY/04/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2008 ජනවාරි මස 1 දින සිට කොමදෝරු (සැ.) වශයෙන්

කපිතාන් (සැ) (තාවකාලික කොමදෝරු (සැ) සරත් දිසානායක, යූඑස්පී, ශ්‍රීලංනාහ-එන්ආර්එස් 0169

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

08-632

2008 අංක 469

D/RF/824/NY/04/04.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2007 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කොමදෝරු (ඉ) වශයෙන් :

කපිතාන් (ඉ) වීරසිංහ මුදලිගේ පාලිත ලක්සුමන වීරසිංහ, පීඑස්සී, ශ්‍රීලංනාහ එන්ආර්ඊ 0204

කපිතාන් (ඉ) හම්බනගේ දොන් රෝහිත නිලන්ත ප්‍රේමසිරි, ශ්‍රීලංනාහ -එන්ආර්ඊ 0225

කපිතාන් (ඉ) සේනානායක අමරසිංහගේ සරත්චන්ද්‍ර අමරසිංහ, ශ්‍රීලංනාහ එන්ආර්ඊ 0313

කපිතාන් (ඉ) මොහොට්ටාලගේ උදය කීර්ති විජය බණ්ඩාර ශ්‍රීලංනාහ -එන්ආර්ඊ 0226

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-649

2008 අංක 470

D/22/NY/410.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 නොවැම්බර් මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (සැ) ඕවිටේආරච්චිගේ නිෂාද් සුගීස්වර, ශ්‍රී ලංනාහ - එන්ආර්එස් 0429

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-634/1

2008 අංක 471

D/22/NY/410.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2007 නොවැම්බර් මස 23 වන දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාන්ඩර් (සැ) ඕවිටේආරච්චිගේ නිෂාද් සුගිස්වර, ශ්‍රීලංනාහ- එන්ආර්එස් 0429

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-634/2

---

2008 අංක 472

D/RF/832/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

මරණයෙන් පසු උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2007 දෙසැම්බර් මස 26 දින සිට කොමාණ්ඩර් වශයෙන් මරණයෙන් පසුව උසස් කිරීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් ඒකනායක ආරච්චිලාගේ ලලිත් චමින්ද ඒකනායක, එන්ආර්එක්ස් 1222, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමණ්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-655

---

2008 අංක 473

D/RF/832/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව- ස්ථිර නාවික බලකාය**

මරණයෙන් පසු උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූනි මස 17 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් (වියාබ) වශයෙන් මරණයෙන් පසුව උසස් කිරීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (වියාබ) සුදේශ් කුමාර දළුගම, එන්ආර්ඉසෙඩ් 1132, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ක් වූ ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-654

---

2008 අංක 474

D/RF/832/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

මරණයෙන් පසු උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 නොවැම්බර් මස 09 දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් මරණයෙන් පසුව උසස් කිරීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් නුගලියද්දේ ගෙදර චින්තක දෙනුවන් ජයතිලක එන්ආර්එක්ස් 1134, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

08-707

2008 අංක 475

D/22/NY/415.

**ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියා අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිතන් කොමාන්ඩර් (සැ) කන්දේ විදානලාගේ ප්‍රසාද් ඉන්දික, එන්ආර්එස් 0902, ශ්‍රීලංනාහ,

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

08-659

---

2008 අංක 476

D/22/NY/421.

**ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම් සඳහන් නිලධාරියා 2008 ජනවාරි මස 05 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිතන් කොමාන්ඩර් (සංඥා) කරුපයියා අනුර කුමාර, එන්ආර්එක්ස් 0456, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-648

---

2008 අංක 477

D/RF/832/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්ථිර නාවික බලකාය**

මරණයෙන් පසු උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2008 මාර්තු මස 22 වැනි දින සිට ලුතිතන් කොමාණ්ඩර් වශයෙන් මරණයෙන් පසුව උසස් කිරීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් අගම්පොඩි ජානක දිනේෂ් කුමාර මෙන්ඩිස්, එන්ආර්එක්ස් 1674, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-656

---

2008 අංක 478

D/RF/824/NY/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 නොවැම්බර් මස 06 වැනි දින සිට තාවකාලික ලුතිතන් කොමාන්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිතන් (නාසෙ) සුබසිංහ ආරච්චිරාළලාගේ කරුණානන්ද සුභසිංහ- ී එන්ආර්පී 1028, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08-631

2008 අංක 479

D/RF/824/NY/1/6.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2008 පෙබරවාරි මස 17 වැනි දින සිට තාවකාලික ලුතිතන් කොමාන්ඩර් (වි) වශයෙන් :*

ලුතිතන් (වි) තැඹිලියා ගොඩගේ ජීවන් සුගන්ධික කරුණාරත්න, එන්ආර්එල් 1188, ශ්‍රීලංනාහ

*2008 පෙබරවාරි මස 19 වැනි දින සිට තාවකාලික ලුතිතන් කොමාන්ඩර් වශයෙන් :*

ලුතිතන් මොහමඩ් නිෂාම් මොහමඩ් අර්ෂඩ්, එන්ආර්එක්ස් 1331, ශ්‍රීලංනාහ

*2008 මාර්තු මස 01 වැනි දින සිට තාවකාලික ලුතිතන් කොමාන්ඩර් (විආ) වශයෙන් :*

ලුතිතන් (විආ) විජේසුන්දර සභාපති මුදියන්සේලාගේ නිලංග දීපාල් විජේසුන්දර, එන්ආර්ආර් 1370, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08-630

---

2008 අංක 480

D/22/NY/417.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2007 ඔක්තෝබර් මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරියා අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිතන් හෙට්ටියාදුර ප්‍රසාද් බ්‍රින්ඩ්ලි සෙනරත් ප්‍රනාන්දු, එන්ආර්එක්ස් 1330, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-635

---

2008 අංක 481

D/VF/231/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික උපසේවයට මාරුකිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට 2008 ජනවාරි 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාන්ඩර් (ස්වේ) ආරියප්පෙරුම රාමනායකලාගේ සෝමපාල, එන්වීඑක්ස් 5072 - ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-650

---

D/VF/230/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

2007 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්වේච්ඡා බලකායේ පහත නම් සඳහන් නිලධාරීන් අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් (ස්වේ) උපාලි හේමචන්ද්‍ර කහඳව, එන්වීඑක්ස් 5127, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) කපුරු බංඩාගේ කරුණාරත්න බංඩාර, එන්වීඑක්ස් 5193, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) අගාරගේ කීර්ති සෙනරත් නානායක්කාර, එන්වීඑක්ස් 5211, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) මහකුඹුරේ ගෙදර සුසන්ත රණසිංහ, එන්වීඑක්ස් 5217, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) ලලිත් බන්දුල විජේසිරි, එන්වීඑක්ස් 5228, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) ගාල්ලගේ දොන් ශ්‍රියා රංජනී, එන්වීඑක්ස් 5274, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) රත්නායක මුදියන්සේලාගේ සුසිල් ගාමිණී රත්නායක, එන්වීඑක්ස් 5287 ශ්‍රීලංස්වේනාහ
වෛද්‍ය ලුතිතන් (ස්වේ) ප්‍රමුක් මහේෂ ජයතිලක, එන්වීඑම් 5299, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) උඩගෙදර ගෝකුල ජයවීර, එන්වීඑක්ස් 5357, ශ්‍රීලංස්වේනාහ
ලුතිතන් (ස්වේ) ජනාද් චන්දික කුලරත්න මලලගම, එන්වීඑක්ස් 5358, ශ්‍රීලංස්වේනාහ
උප ලුතිතන් (ස්වේ) කුලතුංග ආරච්චිගේ සුදත් යසලාල්, එන්වීඑක්ස් 5181, ශ්‍රීලංසේවේනාහ
උප ලුතිතන් (ස්වේ) ගොඩිගමුව ආචාරිගේ සමන් සමන්ත, එන්වීඑක්ස් 5254, ශ්‍රීලංස්වේනාහ
උප ලුතිතන් (ස්වේ) අබේවික්‍රම දිසානායක කුලරත්න, එන්වීඑක්ස් 5286, ශ්‍රීලංස්වේනාහ
උප ලුතිතන් (ස්වේ) උඩඅරඹේ ගමරාලලාගේ ලලිත් හේමන්ත ජයවර්ධන, එන්වීඑක්ස් 5290, ශ්‍රීලංස්වේනාහ
උප ලුතිතන් (ස්වේ) රණවීර කලුආරච්චිගේ නිව්ටන් රත්නසිරි, එන්වීඑක්ස් 5298, ශ්‍රීලංස්වේනාහ
උප ලුතිතන් (ස්වේ) රාජවසම් මුදියන්සේලාගේ මලිත් හසන් ප්‍රදීප් ලක්මාල් ගුණරත්න රාජවසම්, එන්වීඑක්ස් 5346, ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) ඩිංගිරි බංඩාගේ ප්‍රේමතිලක, එන්වීඑක්ස් 5191, ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) බුද්ධදාස වික්‍රමරත්න ගුණසේකර, එන්වීඑක්ස් 5203, ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) කවුල්පත පොල්ගස්දෙනියේ ගෙදර අශෝක ධර්මරත්න, එන්වීඑක්ස් 5208, ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) මාතරච්චාරි ධීෂණ ප්‍රියන්ත ජයවීර, එන්වීඑක්ස් 5223, ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) රාජවර්ධන ගෙදර විජයවර්ධන, එන්වීඑක්ස් 5224, ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) වටගොඩ ගෙදර නන්දන චන්ද්‍රපාල, එන්වීඑක්ස් 5246 ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) හේන්ගල විතානගේ ජයන්ත උදය ශාන්ත, එන්වීඑක්ස් 5256 ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) සමිර දූෂ්‍යන්ත ද සොයිසා නවරත්න, එන්වීඑක්ස් 5344, ශ්‍රීලංස්වේනාහ
වැ/බ උප ලුතිතන් (ස්වේ) චමිල සුරංග ගනේගොඩ, එන්වීඑක්ස් 5359, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-643

2008 අංක 482

D/VF/225/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක්

2006 නොවැම්බර් මස 15 වැනි දින සිට ලුතිතන් කොමාන්ඩර් (ස්වේ) වශයෙන් :

අධිකාරි මුදියන්සේලාගේ සේනානායක බංඩාර අධිකාරි, ශ්‍රීලංස්වේනාහ -එන්වීඑක්ස් 5398

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

08-658

---

2008 අංක 483

D/VF/193/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 මැයි මස 01 වැනි දින සිට ලුතිතන් කොමාන්ඩර් වශයෙන් :*

ලුතිතන් කංචන දීපසිකා ජයවීර, එන්වීඑකස් 5176. ශ්‍රීලංස්වේනාහ.

*2008 මාර්තු මස 07 වැනි දින සිට ලුතිතන් කොමන්ඩර් වශයෙන් :*

ලුතිතන් රම්මණ්ඩා දේවගේ පත්මසිරි විජේකුමාර, එන්වීඑක්ස් 5201, ශ්‍රීලංස්වේනාහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මැයි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-637

2008 අංක 484

D/VF/193/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 ජුනි මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් ඃ*

ලුතිනන් මොහොට්ටිගේ කපුරුහාමිගේ සුනිල් සෙනවිරත්න, එන්වීඑක්ස් 5192, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්‍ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්‍ෂක, මහජන ආරක්‍ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-638

---

2008 අංක 485

D/VF/234/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2008 ජුනි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්වේච්ඡා බලකායේ පහත නම් සඳහන් නිලධාරීන් අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත ඃ

ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) දපන දුරගේ විජයනන්ද චන්ද්‍රදේව, එන්වීඑක්ස් 5138, ශ්‍රීලංස්වේනාහ
වෛද්‍ය ලුතිනන් (ස්වේ) පහුරුතොට ආචාරිගේ සේනක පෙරේරා, එන්වීඩී 5179, ශ්‍රීලංස්වේනාහ
ලුතිනන් (ස්වේ) විජයකෝන් මුදියන්සේලාගේ ගාමිණී විජයකෝන්, එන්වීඑක්ස් 5226, ශ්‍රීලංස්වේනාහ
ලුතිනන් (ස්වේ) වර්ණකුලසූරිය ජෝශප් ටිරෝන් ප්‍රනාන්දු, එන්වීඑක්ස් 5325, ශ්‍රීලංස්වේනාහ
ලුතිනන් (ස්වේ) කහම්බන්නේ ගෙදර ආනන්ද විජය බංඩාර, එන්වීඑක්ස් 5349, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්‍ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්‍ෂක, මහජන ආරක්‍ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-645

2008 අංක 486

D/VF/193/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 ජූලි මස 01 දින සිට තාවකාලික කොමාණ්ඩර් වශයෙන් ඃ*

ලුතිනන් කොමාණ්ඩර් හේවා තොන්ඩිලාගේ සුනිල් මුතුකුමාරන - ශ්‍රීලංස්වේනාහ, එන්වීඑක්ස් 5080
ලුතිනන් කොමාණ්ඩර් දොන් ලාල් ටයිටස් කන්නන්ගර - ශ්‍රීලංස්වේනාහ, එන්වීඑක්ස් 5082

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-636

---

2008 අංක 487

D/VF/235/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2008 මැයි මස 21 වන දින සිට නිත්‍ය නාවික උපසේවයේ සිට ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් හිරිහාමිලාගේ අනුරාධ දිසානායක, නිනාඋසේ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්‍ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08-644

2008 අංක 488

D/VF/233/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2008 අප්‍රේල් මස 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ පහත නම සඳහන් නිලධාරියා අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) හෙට්ටිආරච්චිගේ වසන්ත බන්දුල, එන්වීඑක්ස් 5263, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මාර්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

08-657

---

2008 අංක 489

D/VF/194 /NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව-ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

*2007 මාර්තු මස 02 වන දින සිට උප ලුතිනන් (ස්වේ) වශයෙන් :*

අප්පු හෙන්නදි තොටහේවගේ අනුර,එන්වීඑක්ස් 5406
රණසිංහගේ විජේපාල රණසිංහ,එන්වීඑක්ස් 5407
දේවරාජ මුදියන්සේලාගේ ප්‍රේමලාල් අබේරත්න, එන්වීඑක්ස් 5408
හැරින්ස් ලොකු බංඩාර හුලංගමුව, එන්වීඑක්ස් 5409
රත්නායක මුදියන්සේලාගේ ලක්ෂ්මන් උපාලි රත්නායක, එන්වීඑක්ස් 5410
පටබැඳි මහේන්ද්‍ර අශෝක කොඩිකාර,එන්වීඑක්ස් 5411
කළුබෝවිලගේ ලියෝ සුනිල් පෙරේරා,එන්වීඑක්ස් 5413
කුරුප්පු ජයවර්ධනගේ සමරතුංග, එන්වීඑක්ස් 5414
රදලියගොඩ කංකානමලාගේ සුනිල් රදලියගොඩ, එන්වීඑක්ස් 5415
දිසානායක මුදියන්සේලාගේ බුවනෙකරත්න, එන්වීඑක්ස් 5416
සන්ද්‍රා මරක්කල නන්දන නිහාල් ද සිල්වා, එන්වීඑක්ස් 5417
මත්කන්දේ මුදියන්සේලාගේ ජගත් ප්‍රේමසිරි, එන්වීඑක්ස් 5418
ජාගොඩ ආරච්චිගේ දොන් දයාරත්න, එන්වීඑක්ස් 5419
සම්මන්දප්පෙරුම මොහොට්ටි අප්පුහාමිලාගේ දොන් රංජිත් කරුණාසිරි, එන්වීඑක්ස් 5420
අත්තනායක මුදියන්සේලාගේ ජයරත්න බංඩා, එන්වීඑක්ස් 5421
වතුදුර බන්ධනගේ චන්ද්‍රපාල, එන්වීඑක්ස් 5422
දිසානායක මුදියන්සේලාගේ ගුණරත්න, එන්වීඑක්ස් 5423

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-646

---

2008 අංක 490

D/VF/194/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක්

*2007 ජූලි මස 11 වන දින සිට උප ලුතිනන් (ස්වේ) වශයෙන් :*

සහරා කරේන් බහාර්, ශ්‍රීලංස්වේනාහ, එන්වීඑක්ස් 5432

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-647

---

2008 අංක 491

ඩී/ඒඑන්/10/II.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විං කමාණ්ඩර් නිලයට උසස් කෙරේ :

තාවකාලික විං කමාන්ඩර් අත්තනායක මුදියන්සේලාගේ චමිලින් සමන්තික බණ්ඩාර අත්තනායක (01528) පාලන/රෙජි 2004.12.23

තාවකාලික විං කමාන්ඩර් චන්දික කණිෂ්ක සිරිවර්ධන (01530) පාලන/රෙජි 2004.12.23

තාවකාලික විං කමාන්ඩර් ප්‍රියංකර මෙස්ට්‍රිගේ චින්තක ප්‍රියදර්ශන ඩයස් (01578) පාලන/රෙජි 2005.05.01

තාවකාලික විං කමාන්ඩර් රංචාගොඩ ගමගේ චන්දන දීප්ති රවිහංස (01580) පාලන/රෙජි 2005.06.01

තාවකාලික විං කමාන්ඩර් පාලිත ජයසිංහ අබේසිරිවර්ධන (01703) පාලන/රෙජි 2005.09.01

තාවකාලික විං කමාන්ඩර් උපුල සේනක ලියනසූරිය (01705) කාර්මික/ඉංජි 2005.09.01

තාවකාලික විං කමාන්ඩර් අසුරප්පුලිගේ උපාලි අමරදාස (01706) පාලන/රෙජි 2005.09.01

තාවකාලික විං කමාන්ඩර් තිබ්බොටුවාව විතානගේ ධම්මික දේශප්‍රිය (01708) පාලන/රෙජි 2005.09.01

තාවකාලික විං කමාන්ඩර් පලීර් මොහිදීන් සෙයිඩ් අබ්දුල් රහිම් ජවුෆර් සාතික් (01712) පාලන/රෙජි 2005.09.01

තාවකාලික විං කමාන්ඩර් බාලපුවඩුගේ ලෙනාර්ඩ් සිදත් මෙන්ඩිස් (01714) පාලන/රෙජි 2005.09.01

තාවකාලික විං කමාන්ඩර් කටුකොලින ගමගේ රංජිත් හේමචන්ද්‍ර (01721) පාලන/රෙජි 2005.09.01

තාවකාලික විං කමාන්ඩර් මඩුගල්ලේවලව්වේ ජයතිලක බණ්ඩාර (01615) කාර්මික/ඉංජි 2005.10.05

තාවකාලික විං කමාන්ඩර් සමන් චන්දන කුමාර පල්ලෙවෙල (01628) මෙහෙ/ගුවන් 2005.10.23

තාවකාලික විං කමාන්ඩර් හේවා බෝරුප්පගේ දීසරුවන් ජනක කරුණාරත්න (01630) මෙහෙ/ගුවන් 2005.11.23

තාවකාලික විං කමාන්ඩර් ගජනායක මුදියන්සෙලාගේ ප්‍රියන්ත ගජනායක (01607) කාර්මික/ඉංජි 2005.12.01

තාවකාලික විං කමාන්ඩර් මහවඩුගේ මිගාර දයා ශ්‍රී පෙරේරා (01621) පරිපාලන 2006.01.17

තාවකාලික විං කමාන්ඩර් පොල්ගම්පොල රැල්ලගේ නන්දන බණ්ඩාර අබේරත්න(01624) පරිපාලන 2006.01.17

තාවකාලික විං කමාන්ඩර් රොෂාන් අරුල්කුමාර් ජේකොබ් (01625) පරිපාලන 2006.01.17

තාවකාලික විං කමාන්ඩර් ජනක ආදර්ශ් නානායක්කාර (01626) පරිපාලන 2006.01.17

තාවකාලික විං කමාන්ඩර් ෂෙහාන් ජෝශප් සුරේන්ද්‍ර ප්‍රනාන්දු (01636) නි.පො.රා. 2006.02.14

තාවකාලික විං කමාන්ඩර් චන්ද්‍රකුමාර ජයසිරි බටගොඩ (01707) පාලන/රෙජි 2006.04.01

තාවකාලික විං කමාන්ඩර් රාජකරුණා ආරච්චිගේ ප්‍රියන්ත උදයකුමාර ජයවික්‍රම (01617) කාර්මික/සංඥා 2006.04.05

තාවකාලික විං කමාන්ඩර් රොෂාන් සේනක බියන්විල (01644) පරිපාලන 2006.05.26

තාවකාලික විං කමාන්ඩර් රවීන්ද්‍ර පණ්ඩුකාභය ලියනගමගේ (01641) නි. පො. රා. 2006.07.01

තාවකාලික විං කමාන්ඩර් හැඩිගලගේ සම්පත් සුජීව තුයියකොන්තා (01642) නි. පො. රා. 2006.07.01

තාවකාලික විං කමාන්ඩර් ප්‍රසන්න රණසිංහ (01646) කාර්මික/ඉංජි 2006.07.06

තාවකාලික විං කමාන්ඩර් කලුතර ගුරුන්නාන්සේලාගේ දොන් නිහාල් ජයසිංහ (01647) කාර්මි/ඉංජි 2006.07.06

තාවකාලික විං කමාන්ඩර් තම්මිට ආරච්චිගේ දොන් රංජිත් සේනානායක (01648) කාර්මික/ඉංජි 2006.07.06

තාවකාලික විං කමාන්ඩර් සුජීවන් කීර්ති අබේගුණසේකර සේනාරත්න (01650) කර්මික/ඉංජි 2006.07.06

තාවකාලික විං කමාන්ඩර් ශ්‍යාමිල් රිස්මි තජුඩීන් (01591) පාලන/රෙජි 2006.07.10

තාවකාලික විං කමාන්ඩර් වීරමුන්දගේ රුමේෂ් සංජය ප්‍රනාන්දු (01652) පාලන/රෙජි 2006.07.13

තාවකාලික විං කමාන්ඩර් ගෙරොන ගමගේ වරුණ තිලක් කුමාර ගුණවර්ධන (01655) පාලන/රෙජි 2006.07.13

තාවකාලික විං කමාන්ඩර් වරුණ සංජීව සේනාරත්න (01657) පාලන/රෙජි 2006.07.13

තාවකාලික විං කමාන්ඩර් කලුආරච්චි කංකානමලාගේ අතුල කුමාර කලුආරච්චි (01659) පාලන/රෙජි 2006.07.13

තාවකාලික විං කමාන්ඩර් දොන් චන්ද්‍රලාල් ඉන්ද්‍රජිත් වීරසූරිය (01661) පාලන/රෙජි 2006.07.13

තාවකාලික විං කමාන්ඩර් කීර්ති වත්තිගම (01665) පාලන/රෙජි 2006.07.13

තාවකාලික විං කමාන්ඩර් අරෝෂ් සුරේන්ද්‍ර විතාන (01666) කාර්මි/සංඥා 2006.07.17

තාවකාලික විං කමාන්ඩර් ජයසේකර පාලිත බාලසූරිය (01668) කාර්මික/සංඥා 2006.07.17

තාවකාලික විං කමාන්ඩර් කාරියවසම් මජුවානා ගමගේ බන්දුල ප්‍රියකාන්ත (01699) කාර්මි/සංඥා 2006.07.17

තාවකාලික විං කමාන්ඩර් තුම්බෙ දූර එඩී හැරිසන් (01720) පාලන/රෙජි 2006.09.01

තාවකාලික විං කමාන්ඩර් විරාජ් නිලංග පණ්ඩිතසේකර (01681) කාර්මික/ඉංජි 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් රාජ් නිශාන්ත තිලකසිංහ (01687) උපකරණ 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් චන්දිමාල් හේමන්ත රන්සිරි සොයිසා (01693) පරිපාලන 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් තුසිත අමල් විමලරත්න (01683) කාර්මි/සංඥා 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් පට්ටිය පතිරණලාගේ ටයිටස් ඔස්මන්ඩ් ඇල්බර්ට් පීරිස් (01674) කාර්මික/ඉංජි 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් හෙට්ටිආරච්චිගේ රංජන් බෙනඩික්ට් ශ්‍රියන්ත තිසේරා (01690) පරිපාලන 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් රාජපක්ෂ අප්පුහාමිලාගේ උදේනි ප්‍රියදර්ශන රාජපක්ෂ (01695) නි.පො.රා. 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් අනුර බොරලුවෙ බණ්ඩාර රත්නායක (01676) කාර්මි/ඉංජි 2006.10.05

තාවකාලික විං කමාන්ඩර් කඳබොඩගේ මලින්ද සමන් විජේනායක (01689) උපකරණ 2006.10.05

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

08-706

2008 අංක 492

ඩී/ඒඑෆ්/21/2.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රන්දෙනිය මුදලිගේ ලක්ෂ්මන් රන්දෙනිය (02109) උපකරණ- 2006.01.06

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් දසනායක මුදියන්සේලාගේ සමන්තිලක බණ්ඩාර දිසානායක (02111) උපකරණ - 2006.01.06

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මුහන්දිරම් හන්තාන මුදියන්සෙලාගේ තුෂාර චමින්ද කුමාර බණ්ඩාර (02024) මෙහෙයුම්/ගුවන්- 2006.11.28

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ගයිරාන ගමගේ සජීන්ද්‍ර රුවන් කුමාර ගුණවර්ධන (01950), මෙහෙයුම්/ගුවන් - 2007.01.04

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් තල්පාවිල විදාන කංකානම්ගේ දර්ශන චතුරන් ඩයස් (02045), නි.පො.රා. - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් කපිල රෝහිත ප්‍රියංකර ඒකනායක (02049), කාර්මි/සංඥා - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ශම්මි දිල්රුක් බරුපොල, (02050) කාර්මි/සංඥා - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සච්සිරි ගෙදර නිශාන්ත උදය කුමාර වික්‍රමසිංහ (02051), උපකරණ - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හංවැල්ලගේ අරුණ ධාරක ඩයස් (02052), උපකරණ - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සම්පත් විරංග ප්‍රේමවර්ධන, (02053) උපකරණ - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ජයලත්ගේ ගුණවර්ධන ජයලත් (02054) පරිපාලන -2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මංජුල ප්‍රගීත් වීරසිංහ (02055), පරිපාලන - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් පඩුවාවල කංකානමලාගේ චන්ද්‍ර දිනේෂ් පඩුවාවල (02056), පරිපාලන - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හේරත් මුදියන්සේලාගේ චමින්ද හේරත් (02057), පාලන/රෙජි - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සංජීව ප්‍රභාත් අබේරත්න (02059), මෙහෙයුම්/ගුවන් 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් අසුරප්පුලිගේ ධනංජය අමරබන්දු (02416), ගු.තො.නි. - 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලන්ත ගමගේ (02421), ගු.තො.නි.- 2007.01.07

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ශෂිකා හේෂානි හෙට්ටිආරච්චි (ඕඩබ්/01030), උපකරණ - 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ප්‍රශන්තිකා ගයානි ද මෙල් (ඕඩබ්/01033), උපකරණ - 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් බියංකා මෙන්ඩිස් ගුණසේකර විජේසිරිවර්ධන (ඕඩබ්/01035), උපකරණ - 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් වෙදගෙදර නිසංසලා සරිදාදේවි ගුණරත්න (ඕඩබ්/01039), උපකරණ - 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රමනී ප්‍රවනීනීතා ධනංසූරිය (ඕඩබ්/01040), උපකරණ- 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ධම්මි ශානිකා ලියනආරච්චි (ඕඩබ්/01041), උපකරණ - 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මුල්ගොඩ හේවගේ කාංචනා දිල්රුක්ෂි (ඕඩබ්/01042), උපකරණ- 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ඉනෝකා මෙලනි ධර්මදාස (ඕඩබ්/01045), පරිපාලන - 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් පුෂ්පිකා සුභාෂිනී වරකාගොඩ(ඕඩබ්/01047), පරිපාලන - 2007.06.16

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රාජපක්ෂ මානුක්කුනම්බි අනුපමා ඉෂාන්ති සිල්වා (02068), උපකරණ - 2007.07.04

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සුජීවනී ප්‍රියන්තා පුංචිහෙට්ටි(02069), උපකරණ - 2007.07.04

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

08-660

---

2008 අංක 493

ඩී/ඒඑෆ්/21/2.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ඥාණසිරි කරන්දෙනිය (02296) - වෛද්‍ය 2007.05.10

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ජයමහ හිටිහාමිලාගේ දීපාල් කුමාර ජයමහ (01936) - දන්ත 2007.07.31

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හේවාවසම් පිටියගේ අරුණ සම්පත් හේවාවසම් (01889) - වෛද්‍ය 2007.09.10

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මරියනාදන් වෙතෝතයන් (02422) - වෛද්‍ය 2008.10.14

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් බාබා රහුමන් බූසෝ (01901) වෛද්‍ය 2008.01.21

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් දෝන සුභාෂිනී ශ්‍රීයන්ජිතා රත්නවීර (02293) - වෛද්‍ය 2008.05.21

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හේවා මලවිගේ අජන්තා ප්‍රියදර්ශනී (02294) - වෛද්‍ය 2008.07.18

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-651

2008 අංක 494

ඩී/ඒඑෆ්/31/T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

2007 ජූලි මස 19 වැනි දින සිට පහත නම් සඳහන් නිලධාරින් ඔවුන්ගේ නම්වලට පෙර දක්වා ඇති නිලයන් යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරියට පත් කිරීමටත් එදින සිටම ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුලත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කොට ඇත.

ෆලයිට් ලෙෆ්ටිනන්ට් ඒකනායක මුදියන්සේලාගේ චන්දන සුගත්සිරි ඒකනායක (02632) පාලන/වෛද්‍ය
ෆලයිට් ලෙෆ්ටිනන්ට් රත්නසිරි දිසානායක (02633) පාලන/වෛද්‍ය
ෆලයිට් ලෙෆ්ටිනන්ට් රාජපක්ෂ රාජකරුණා විජේකෝන් වාසල මුදියන්සෙ රාලහාමිලාගේ රුවන් ප්‍රියදර්ශන හලංගොඩ (02634) පාලන/වෛද්‍ය
ෆලයිං ඔෆිසර් ජයශංඛ ලියනපතිරණ (02636) කාර්මික/සංඥා
ෆලයිං ඔෆිසර් මාගලගේ එරන්ද උදය කුමාර පෙරේරා (02637) පාලන/කෘෂි
ෆලයිං ඔෆිසර් හැඩිගල්ලගේ ක්‍රිශාන්ත චන්දන හැඩිගල්ල (02638) පාලන/කෘෂි
ෆලයිං ඔෆිසර් කුලතිලක අත්තනායක මුදලිගේ කමල් ප්‍රියන්ත ජයසිරි (02639) පාලන/කෘෂි
ෆලයිං ඔෆිසර් අමුණුගම දිසානායකගේ සිද්ධික නිමලශාන්ත දිසානායක (02640) පාලන/කෘෂි
පයිලට් ඔෆිසර් රත්‍රං අරුකට්ටි පටබැඳිගේ සාරංග දයා ක්‍රිශාන්ත (02641) පාලන/රෙජිමේන්තුව
පයිලට් ඔෆිසර් ලසන්ත දිලීප මාලන් වර්ණකුලසූරිය (02642) පාලන/රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-661

---

2008 අංක 495

ඩී/ඒඑෆ්/31/T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක්

2006 ජූලි මස 06 වැනි දින සිට පහත නම් සඳහන් කැඩෙට් නිලධාරින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ෆයිලට් ඔපිසර්වරුන් වශයෙන් පත් කිරීමටත් එදිනම සිට ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කොට ඇත.

11370 කැඩෙට් නිලධාරී රංගන විනෝද් ජයසිංහ නි.පො.රා. (02663)
11374 කැඩෙට් නිලධාරී විබැද්ද අධිකාරම් මුදියන්සේලාගේ බුද්ධි නන්දන බණ්ඩාර විබැද්ද, නි. පො. රා. (02664)
11373 කැඩෙට් නිලධාරී ඉෂාන් සමීර බණ්ඩාර තිබ්බොටුමුනුව නි .පො. රා (02665)
11369 කැඩෙට් නිලධාරී දොන් ලක්ෂිත කොළඹගේ නි. පො.රා. (02666)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

08 -653

---

2008 අංක 496

ඩී/ඒඑෆ්/31/ටී/1.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීමක්

2004 ජනවාරි මස 09 වැනි දින සිට පහත නම් සඳහන් කැඩෙට් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් වරයෙකු වශයෙන් අධිකාරියට පත් කිරීමටත් එදිනම සිට ඔහුගේ නමට ඉදිරියෙන් ඇති ශාඛාවට ඇතුලත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කොට ඇත.

11232 කැඩෙට් නිලධාරී සේනාරත්න මුදියන්සේලාගේ නිසංග දිල්ෂාන් සේනාරත්න (02682) - කාර්මික/ඉංජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්පී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මාර්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

08-652

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 497

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :

එච්. එස්. ධර්මවර්ධන මහතා 2007 ජුනි මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වශයෙන්.

08-750

# ආණ්ඩුවේ නිවේදන

## වන්දනා ගමන් ආඥා පනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝගය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2008 ජුලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාලයේ (වාර්ෂික උත්සව) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල -

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුලත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුලත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුල නතර වී තිබෙන යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද ඇතුලත් වේ. තවද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ගොන්නව ශ්‍රී විෂ්ණු දේවස්ථානයේ උත්සවය සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාල වන්නේය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේය.

5. (1) කඳවුරු පෙදෙස තුලට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුලත හෝ වාහන ගමනා ගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතකු හෝ කඳවුරු පෙදෙස තුලට ගෙන ඒම නොකල යුතුය. එසේ වූවද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කා ගෙන යාම හෝ සම්බන්ධයෙන් මේ නියෝග අදාල නොවන්නේය.

7 (1) කඳවුර පෙදෙස ඇතුලත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන
(ආ) කරත්ත හා ගොනුන් නවතා තබන ස්ථාන
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන
(ඈ) අසනීප වන වන්දනා කරුවන්ට නතරවීම පිණිස ස්ථාන
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම පිණිස ස්ථාන
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන
(උ) විවිධ කාර්යය සඳහා මඩු ඉදි කිරීමට හැකි ස්ථාන
(ඌ) සේදීමේ කාර්යය සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන
(එ) ස්නානය කාර්යය සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන

(ඒ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන,

(ඕ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ දැක්වෙන යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක්, ඒ ස්ථානයේ දැන්වීමක් හෝ නාම පුවරුවක් හෝ ප්‍රදර්ශනය කිරීමෙන් වෙන් කරනු ලැබිය හැකිය.

(3) දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයා විසින් (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවකදී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වළක්වාලීම ගැනීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරින් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කළ හොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස, කිසිම තැනැත්තෙකු විසින් 7 වෙනි නියෝග යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක කවර හෝ කවර කාර්යයක් සඳහා යම් මඩුවක් හෝ යම් තාවකාලික ගොඩනැගිල්ලක් හෝ යම් ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ වෙනත් ඉදි කිරීමකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් තනනු ලැබුවහොත් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අලුතින් කොටසක් එකතු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ගොඩනැගිල්ල හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අලුතින් එකතු කරන ලද කොටස ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාරදෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක්ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව, ගොඩනැගිල්ල, ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට හෝ අළුතින් කරන ලද කොටස ඉවත් කිරීමට හෝ කඩා දැමීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම නීත්‍යානුකූල වන අතර, එකී ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන් උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා යම් ඉඩමකට හෝ භූමියකට ඇතුල්වීමද, එය ඉවත් කිරීම හෝ කඩාදැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේය.

10. යම් වැසිකිලියක හෝ වැසිකිලියක් අසල හෝ දැන්වීමක් හෝ සංඥා පුවරුවක් ප්‍රදර්ශනය කිරීමෙන් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළ මූත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතුය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක ජලාශයක, ඇලක දොලක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැළිකසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිකසල දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනා කරුවන්ට සියලු ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතුය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම නොකරනු ලැබිය යුතුය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පාවිච්චියට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

15. බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව මිස

කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක එවැනි බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යෑම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයා හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතුය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා හෝ සෑහීමකට පත් වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතුය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාර හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේදී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවත ලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසිකරනු නොලැබිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එසේම, අපද්‍රව්‍ය ඉතිරි වූ කිරි කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසල පොළවේ විසි කොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානයක බේකරියක්, කැවිලි හලක්, කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් හැර එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2 කට (ඝන අඩි 4 1/2 ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය හෝ ලෝහමය කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසළ බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතුය.

20 (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙය නියෝග වල 15 වැනි, 16 වැනි, 17 වැනි, 18 වැනි හෝ 19 වැනි නියෝගය කඩකරමින් පිහිටවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට ඇත්තේය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල නියමයක් අනුව ක්‍රියා කළ යුතුය.

21. යම් අසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීමද ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගී කරගතයුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් අසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්මද යම් තැනැත්තෙකුට යම් අසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන විටකත් සෑම තැනැතෙක්මද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ පෙලෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාර පාන බෙදාහැරීමේදී, විකිණීමේදී, හෝ නිෂ්පාදනය කිරීමේදී හෝ සහභාගි වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතුය.

25. යම් බේකරියක කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍ර ධාරියෙකු විසින් හෝ යම් නවාතැන් පලක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙලෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ නවැතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරි විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයකදී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතුය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිණිකෙලි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකල යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම සහ,

(ආ) 7 වැනි නියෝග යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේය.

30. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්:-

(අ) 6 වැනි නියොගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් ඕනෑම වෙලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බමුණකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 1236 පානව ග්‍රාම නිලධාරි වසමේ ගොන්නව ශ්‍රී විෂ්ණු මහා දේවාලය පිහිටි භූමි භාගය.

*ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ.*

උතුරට : ඩී. එම්. පුංචි බණ්ඩා මහතාට අයිති ඉඩම්, නැගෙනහිරට : ඒ. ජී. අමරසිංහ මහතාට සහ පවුලේ අයට අයිති ඉඩම සහ සූරියගොඩ ගම්, මායිම, දකුණට : සූරියගොඩ ගම් මායිම, බස්නාහිරට : ආර්. ඇම්. ප්‍රේමතිලක මහතාට අයිති ඉඩම සහ තවත් අයට අයිති ඉඩම්.

*පෙරහැර ගමන් ගන්නා මාර්ගය.-*

දේවාලයේ සිට වාරියපොළ කළුගමුව මහා මාර්ගයට ඇති ප්‍රවේශ මාර්ගයේ මීටර් 100 ක් පැමිණ, එතැන් සිට කළුගමුව දෙසට බමුණාකොටුව මංසන්ධියට කි. මීටර් 2.5 ක් ද, බමුණාකොටුව මංසන්ධියෙන් මහකෙළිය කටුපොත මාර්ගයේ කටුපොත දෙසට සියඹලන්ගොමුව මංසන්ධිය (පිංතාලිය හන්දිය) දක්වා කි. මීටර් 4 පමණ ද, එතැන් සිට ගංතිරියාව ග්‍රාමයට යන ප්‍රාදේශීය සභා මාර්ගයේ කි. මී. 1.5ක් පමණ ගමන් කර වමට හැරී මැතක දී සාදන ලද අතුරු මාර්ගයෙන් මීටර් 500 ක් පමණ දුරින් තල්ගහගම ග්‍රාම නිලධාරි වසමේ හමන්ගල්ල ගමේ කොළමුණු ඔය දිය කැපුම් තොටුපළ වශයෙන් භාවිතා කරයි.

08-678/2

### වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝගය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2008 ජූලි මස 29 වැනි දින
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග කොත්මලේ මොරපේ ශ්‍රී කතරගම දේවාල (වාර්ෂික උත්සව) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල -

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයන් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී තිබෙන යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද ඇතුළත් වේ. තවද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස්වේ.

3. මේ නියෝග නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ කොත්මලේ මොරපේ ශ්‍රී කතරගම දේවාලයේ උත්සවය සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටපතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතකු හෝ කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකල යුතුය. එසේ වුවද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කා ගෙන යාම හෝ සම්බන්ධයෙන් මේ නියෝග අදාල නොවන්නේය.

7 (1) කඳවුර පෙදෙස ඇතුලත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන
(ආ) කරත්ත හා ගොනුන් නවතා තබන ස්ථාන
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන
(ඈ) අසනීප වන වන්දනාකරුවන්ට නතරවීම පිණිස ස්ථාන
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම පිණිස ස්ථාන
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන
(උ) විවිධ කාර්යය සඳහා මඩු ඉදි කිරීමට හැකි ස්ථාන
(ඌ) සේදීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන
(එ) ස්නානය කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන
(ඒ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන
(ඔ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ දැක්වෙන යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක්, ඒ ස්ථානයේ දැන්වීමක් හෝ නාම පුවරුවක් හෝ ප්‍රදර්ශනය කිරීමෙන් වෙන් කරනු ලැබිය හැකිය.

(3) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවකදී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුලත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වලක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට ලිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ලිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කල හොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කොන්දේසි වලට අනුකූලව මිස, කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝග යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුලුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක කවර හෝ කවර කාර්යයක් සඳහා යම් මඩුවක් හෝ යම් තාවකාලික ගොඩනැගිල්ලක් හෝ යම් ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක්, තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ වෙනත් ඉදි කිරීමකට අළුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් තනනු ලැබුවහොත් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අළුතින් කොටසක් එකතු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුලත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ගොඩනැගිල්ල හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අළුතින් එකතු කරන ලද කොටස ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාරදෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක්ද යන්න පිලිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව, ගොඩනැගිල්ල, ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට හෝ අළුතින් එකතු කරන ලද කොටස ඉවත් කිරීමට හෝ කඩා දැමීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම නීත්‍යානුකූල වන අතර, එකී ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහතිකව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා යම් ඉඩමකට හෝ යම් භූමියකට ඇතුළුවීමද එය ඉවත්කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියළු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේය.

10. යම් වැසිකිලියක හෝ වැසිකිලියක් අසල හෝ දැන්වීමක් හෝ සංඥා පුවරුවක් ප්‍රදර්ශනය කිරීමෙන් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මල මුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතුය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ලිඳක, දිය වලක ජලාශයක, ඇලක දොලක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැළිකසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුල ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිකසල දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට සියළු ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/

දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස් වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතුය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම නොකරනු ලැබිය යුතුය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පාවිච්චියට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

15. බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක එවැනි බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ හෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යෑම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයා හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතුය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියළුම බේකරි, කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, හෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියළු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුලත විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියළුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත් වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතුය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාර හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේදී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවත ලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසිකරනු නොලැබිය යුතුය. එවැනි සියළු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවත ලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එසේම, අපද්‍රව්‍ය ඉතිරි වූ කිරි කොටස් හෝ ඉවත ලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුලත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසල පොලවේ විසි කොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානයක බේකරියක්, කැවිලි හලක්, කැවිලි සාදන ස්ථානයක්, හෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදුවීම වැලැක්වීමට අවශ්‍ය සියළුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කල බව ඔප්පු කරනු ලැබුවහොත් හැර එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියළු බේකරි, කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, හෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2 කට (ඝන අඩි 4 1/2 ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය හෝ ලෝහමය කසල බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසල තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසල ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතුය.

20 (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝග වල 15 වැනි, 16 වැනි, 17 වැනි, 18 වැනි හෝ 19 වැනි නියෝගය කඩකරමින් පිහිටවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, හෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ හෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල නියමයක් අනුව ක්‍රියා කලයුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීමද ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගී කරගතයුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකල යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් අසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැලදී ඇති සෑම තැනැත්තෙක්මද යම් තැනැත්තෙකුට යම් අසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැලදී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන විටකත් සෑම තැනැතෙක්මද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කල යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ පෙලෙන්නේ යයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුලත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, හෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාර පාන බෙදාහැරීමේදී, විකිණීමේදී, හෝ නිෂ්පාදනය කිරීමේදී හෝ සහභාගි වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතුය.

25. යම් බේකරියක කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක හෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන් පලක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ෂක රෝගයකින් හෝ පෙලෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, හෝජනාගාරයේ, දන්සැලේ නවැතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ෂක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරි විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කල යුතුය.

26. 7 වැනි නියෝගයන් යටතේ හිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයකදී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකල යුතුය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙලි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකල යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකල යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්.-

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම සහ,

(ආ) 7 වැනි නියෝග යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේය.

30. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්:-

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවස අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීම යෝග්‍ය යයි හෝ මහජන යහපත පිණිස වන්නේ යයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් ඕනෑම වේලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරපේ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයේ මොරපේ ශ්‍රී කතරගම දේවාලය පිහිටි භූමි භාගය.

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ.

| | | |
|---|---|---|
| උතුරට | - | උලපනේ පුස්සැල්ලාව මාර්ගය, |
| දකුණට | - | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලහා රක්ෂිතය, |
| නැගෙනහිර | - | මහවැලි රක්ෂිතය, |
| බස්නාහිරට | - | රක්ෂිතය. |

*පෙරහැර වීදිය*

උලපනේ මාර්ගයේ දේවාලය අභියස සිට යතුරුගහලියද්ද විහාරය දක්වා.

08-678/1

---

**වන්දනා ගමන් ආඥා පනත**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝගය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2008 ජුලි මස 29 වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග ජංකුරේ ශ්‍රී විෂ්ණු දේවාලයේ (වාර්ෂික උත්සවය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග වල -

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් කරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුලත්වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුලත් වී කවර හෝ කාර්යයන් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී තිබෙන යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද ඇතුලත්වේ. තවද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස්වේ.

3. මේ නියෝග කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ජංකුරේ ශ්‍රී විෂ්ණු දේවස්ථානයේ උත්සවය සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනා ගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතකු හෝ කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතුය. එසේ වුවද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කා ගෙන යාම හෝ සම්බන්ධයෙන් මේ නියෝග අදාළ නොවන්නේය.

7 (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේය :

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;

(ආ) කරත්ත හා ගොනුන් නවතා තබන ස්ථාන ;

(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;

(ඈ) අසනීප වන වන්දනාකරුවන්ට නතරවීම පිණිස ස්ථාන ;

(ඉ) සිගමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම පිණිස ස්ථාන ;

(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;

(උ) විවිධ කාර්යය සඳහා මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;

(ඌ) සේදීමේ කාර්යය සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(එ) ස්නානය කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(ඒ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(ඕ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ දැක්වෙන යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක්, ඒ ස්ථානයේ දැන්වීමක් හෝ නාම පුවරුවක් හෝ ප්‍රදර්ශනය කිරීමෙන් වෙන් කරනු ලැබිය හැකිය.

(3) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවකදී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වලක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කළ හොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කොන්දේසි වලට අනුකූලව මිස, කිසිම තැනැත්තෙකු විසින් 7 වෙනි නියෝග යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුලුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක කවර හෝ කවර කාර්යයක් සඳහා යම් මඩුවක් හෝ යම් තාවකාලික ගොඩනැගිල්ලක් හෝ යම් ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක්, තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ වෙනත් ඉදි කිරීමකට අළුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් තනනු ලැබුවහොත් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අළුතින් කොටසක් එකතු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ගොඩනැගිල්ල හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අළුතින් එකතු කරන ලද කොටස ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාරදෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක්ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව, ගොඩනැගිල්ල, ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට හෝ අළුතින් එකතු කරන ලද කොටස ඉවත් කිරීමට හෝ කඩා දැමීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම නීත්‍යානුකූල

වන අතර, එකී ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා යම් ඉඩමකට හෝ යම් භූමියකට ඇතුළුවීම ද එය ඉවත්කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියළු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේය.

10. යම් වැසිකිලියක හෝ වැසිකිලියක් අසල හෝ දැන්වීමක් හෝ සංඥා පුවරුවක් ප්‍රදර්ශනය කිරීමෙන් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළ මුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතුය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ලිඳක, දිය වලක, ජලාශයක, ඇලක, දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැළිකසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිකසල දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට සියළු ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතුය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම නොකරනු ලැබිය යුතුය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පාවිච්චියට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

15. බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක එවැනි බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යෑම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයා හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතුය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියළුම බේකරි, කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියළු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියළුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත් වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතුය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාර හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසිමේදී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවත ලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසිකරනු නොලැබිය යුතුය. එවැනි සියළු අපද්‍රව්‍ය, ඉතුරු වූ කොටස් හෝ ඉවත ලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එසේම, අපද්‍රව්‍ය, ඉතිරි වූ කිරි කොටස් හෝ ඉවත ලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසල පොලවේ විසි කොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානයක බේකරියක්, කැවිලි හලක්, කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියළුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් හැර එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියළු බේකරි, කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2 කට (ඝන අඩි 4 1/2 ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය හෝ ලෝහමය කසල බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසල තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසල ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතුය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝග වල 15 වැනි, 16 වැනි, 17 වැනි, 18 වැනි හෝ 19 වැනි නියෝගය කඩකරමින් පිහිටවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල නියමයක් අනුව ක්‍රියා කළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීමද ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගී කරගතයුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැලඳී ඇති සෑම තැනැත්තෙක්මද යම් තැනැත්තෙකුට යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැලඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන විටකත් සෑම තැනැත්තෙක්මද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ පෙලෙන්නේ යයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාර පාන බෙදාහැරීමේදී, විකිණීමේදී, හෝ නිෂ්පාදනය කිරීමේදී හෝ සහභාගි වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතුය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍ර ධාරියෙකු විසින් හෝ යම් නවාතැන් පලක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙලෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ, දන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරි විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගයන් යටතේ හිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයකදී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතුය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙලි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වන නියෝගය හෝ 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්.-

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ,

(ආ) 7 වැනි නියෝග යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේය.

30. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්:-

(අ) 6 වැනි නියෝගය හෝ 27 වන නියෝගය යටතේ දෙන ලද යම් අවස අවසරයක්,
(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්,
(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යයි හෝ මහජන යහපත පිණිස වන්නේ යයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් ඕනෑම වේලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේය.

### *උපලේඛනය*

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 571 ජංකුරේ ග්‍රාම නිලධාරි වසමේ ජංකුරේ ශ්‍රී විෂ්ණු දේවාලය පිහිටි භූමි භාගය.

*ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ :-*

උතුරට : දෙල්විට ඔය, ගල්මුණේ කුඩා ඔය, වලස්ගල්ල කන්ද, නැගෙනහිරට : වත්තේගල්ල කන්ද, වලස්ගල්ල කන්ද, වැලිකන්ද කන්ද හා පන්නගම ගමේ කොටසක්, දකුණට : ගල් ලිඳේ ඇළ, දඹුළුවේ ඇළ, දෙල්විට ඔය, මගුරුපිටිය ගමෙන් කොටසක් හා මගුරුපිටිය ඇළ, බස්නාහිරට : වලස්ගල්ල කන්ද, දැදුරු ඔය හා රැද්දගොඩ ගමින් කොටසක්.

*පෙරහැර ගමන් ගන්නා මාර්ගය.-*

දේවාල භූමියේ සිට රැද්දගොඩ වත්ත හරහා කි. මීටර් 2.5 ක් පමණ දුරින් පිහිටි දැදුරු ඔයේ වඳුරුපිණී ඇල්ල තෙක් පෙරහැර ගමන් කර එහි දිය කැපීම සිදු කර නැවත දේවාලය කරා පෙරහැර පැමිණේ.

08-678/3

## කර්මාන්තශාලා ආඥාපනත

### දැන්වීමයි

1961 අංක 54 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනතින් 1976 අංක 12 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනතින් 1998 අංක 18 දරන කර්මාන්තශාලා (සංශෝධන) පනතින් 2000 අංක 33 දරන කර්මාන්තශාල, (සංශෝධිත) පනතින් හා 2002 අංක 19 දරන කර්මාන්තශාල, (සංශෝධන) පනතින් සංශෝධිත 1942 අංක 45 දරන කර්මාන්තශාල, ආඥාපනතින් දැක්වෙන කර්මාන්තශාලාවන්හි පදිංචිකරුවන් සහ මහජනතාවගේ දැන ගැනීම සඳහා පහත දැක්වෙන කාර්යාල දැනට ක්‍රියාත්මකව පවතින බව දන්වනු ලැබේ.

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ III වන තීරයේ සඳහන් මැතිවරණ කොට්ඨාස සහ පරිපාලන දිස්ත්‍රික්කවල පිහිටි කර්මාන්තශාලාවන්හි පදිංචිකරුවන් විසින් ඉහත කී ආඥාපනත හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසි අනුව කලින් කලට ඉදිරිපත් කළ යුතු සියළුම ලේඛන, වාර්තා, නිවේදන සහ වෙනත් ලියකියවිලි ඉදිරිපත් කිරීමේ දී මින් ඉදිරියට මෙහි II වන තීරුවෙහි සඳහන් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු තැනගේ කාර්යාලයීය ලිපිනයට යැවිය යුතු වන්නේ ය.

සේවයේ යොදවනු ලැබූ තැනැත්තන් කර්මාන්තශාලාවට ඇතුළුවන ප්‍රධාන දොරටුවල මෙම ලිපිනයන් ප්‍රදර්ශනය කිරීම, කර්මාන්තශාලා ආඥා පනතෙහි 90(1)(ආ) වගන්තිය පරිදි කළ යුතු බැවින් එයට මෙයින් අවධානය යොමු කරවමි.

මෙම දැන්වීමෙන් 2004 මැයි මස 14 වැනි දිනැති අංක 1,341 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම සංශෝධනය වේ.

ඩබ්ලිව්. එල්. එස්. විජේසුන්දර,
කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා)
හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු.

2008 අගෝස්තු මස 05 වැනි දින,
කර්මාන්තමය සුරක්ෂිතතා අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
අංක 97, ජාවත්ත පාර,
කොළඹ 05.

### උපලේඛනය

| *තීරුව I*<br>*තනතුර* | *තීරුව II*<br>*ලිපිනය හා දුරකථන අංකය* | *තීරුව III*<br>*භාරව කටයුතු කරන පරිපාලන දිස්ත්‍රික්ක* |
|---|---|---|
| ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, | ප්‍රධාන දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කර්යාලය, කර්මාන්තමය සුරක්ෂිතතා අංශය, කම්කරු දෙපාර්තමේන්තුව, අංක 97, ජාවත්ත පාර, කොළඹ 05. - දුරකථන අංකය : 0112508783 ෆැක්ස් අංකය : 0112508783 | - සියළුම පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, කොළඹ | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, අංක 97, ජාවත්ත පාර, කොළඹ 05. - දුරකථන අංකය : 0112508775 ෆැක්ස් අංකය : 0112508774 | - කොළඹ හා කළුතර පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, ගම්පහ | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, අංක 207, ශ්‍රී බෝධි පාර, ගම්පහ - දුරකථන අංකය : 033 - 2232403 ෆැක්ස් අංකය : 033 - 2232403 | - ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, කුරුණෑගල | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, අංක 143 බී, දකුණු රවුම් පාර, ගැට්ටුවාන, කුරුණෑගල - දුරකථන අංකය : 037 - 2220760 ෆැක්ස් අංකය : 037 - 2220760 | - කුරුණෑගල හා පුත්තලම පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, මහනුවර | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, අංක 218, මහලේකම් කාර්යාලය, මහනුවර - දුරකථන අංකය : 081 - 2225087 ෆැක්ස් අංකය : 081 - 2225087 | - මහනුවර, මාතලේ හා නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්ක |

| තීරුව I තනතුර | තීරුව II ලිපිනය හා දුරකථන අංකය | තීරුව III භාරව කටයුතු කරන පරිපාලන දිස්ත්‍රික්ක |
|---|---|---|
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, ගාල්ල | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, පහළ ඩික්සන් පාර, ගාල්ල - දුරකථන අංකය : 091 - 2225778 ෆැක්ස් අංකය : 091 - 2225778 | - ගාල්ල, මාතර හා හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, යාපනය | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, අංක 133, නාවලර් පාර, යාපනය - දුරකථන අංකය : 021 - 2226333 ෆැක්ස් අංකය : 021 - 2226333 | - යාපනය, මුලතිව්, මන්නාරම, වව්නියාව හා කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, අනුරාධපුර | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, අංක 527/16, ඩී. එස්. සේනානායක මාවත, නව නගරය, අනුරාධපුරය - දුරකථන අංකය : 025 - 2221320 ෆැක්ස් අංකය : 025 - 2221320 | - අනුරාධපුර, පොලොන්නරුව හා ත්‍රිකුණාමලය, මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, රත්නපුර | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, ධර්මපාල මාවත, රත්නපුරය - දුරකථන අංකය : 045 - 2232069 ෆැක්ස් අංකය : 045 - 2232069 | - රත්නපුර හා කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්ක |
| දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු, බදුල්ල | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය, කම්කරු දෙපාර්තමේන්තුව, අංක 96 ඒ, මහියංගන පාර, බදුල්ල - දුරකථන අංකය : 055 - 2223550 ෆැක්ස් අංකය : 055 - 2223550 | - බදුල්ල, පරීක්ෂක මොණරාගල හා අම්පාර පරිපාලන දිස්ත්‍රික්ක |

08-698

---

**මඩ/මණ්ඩූර් ශ්‍රී කන්ද සුවාමි දේවාලයේ වාර්ෂික උත්සවය - 2008**

මඩ/මුණ්ඩූර් ශ්‍රී කන්දසුවාමි දේවාලයේ වාර්ෂික උත්සවය 2008.09.26 වැනි දින ප. ව. 8.00ට කොඩිය එසවීමෙන් ආරම්භ වන අතර ඉන්පසු 2008.09.15 වැනි දින පෙ. ව. 10.00ට දිය කැපීමේ උත්සවය පැවැත්වේ. පසුව එදින 9.00ට කොඩිය පහළට හෙළීමෙන් උත්සවය අවසන් වේ.

1949.05.27 වැනි දින අංක 5,866 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද කොන්දේසි මෙම කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක වන බව මහජනතාවට දැනුම් දෙමි.

උ. උදයශ්‍රීදර්,
ප්‍රාදේශීය ලේකම්,
පෝරතිවුපත්තු.

2008 අගෝස්තු 06 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පෝරතිවුපත්තු.

08-818

---

**හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා නව සාමාජිකයන් දෙදෙනෙකු තෝරා පත්කර ගැනීම**

හෝමියෝපති වෛද්‍ය සභාවෙහි දැනට පුරප්පාඩුව පවතින සාමාජික තනතුරු දෙක සඳහා සුදුසුකම්ලත් නව සාමාජිකයන් දෙදෙනකු පත් කිරීමට 1970 අංක 7 දරන හෝමියෝපති පනතෙහි 3 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ විධිවිධාන යොදා ඇත. මෙම සාමාජිකයන් තෝරා පත් කර ගැනීම රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද හෝමියෝපති වෛද්‍ය සභාවේ ඡන්ද විමසීම් සඳහා වන නියෝගයන්හි විධිවිධානවලට අනුකූලව සිදු කරනු ලැබේ.

ඡන්ද විමසීමේ තේරීම් භාර නිලධාරියා වශයෙන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඊ. එම්. එම්. ආර්. කේ. ඒකනායක මහත්මිය පත් කර ඇත. දැනට හෝමියෝපති වෛද්‍ය සභාවෙහි ලියාපදිංචිය ලබා ඇති සියලුම් හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර පවත්වනු ලබන ඡන්දයෙන් වැලිසර, ෂෙල්ටන් ජයසිංහ මාවත, අංක 94හි පිහිටි හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා නව සාමාජිකයන් දෙදෙනෙකු පත් කිරීමට අපේක්ෂා කෙරේ.

2008.06.31 දිනය වන විට හෝමියෝපති වෛද්‍ය සභාවෙහි ලියාපදිංචිය ලබා ඇති සියලුම හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්ගේ නාම ලේඛනයක් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සහ දිවයින පුරා පිහිටි සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල 2008.08.21 දින සිට 2008.09.21 දින දක්වා කාලය තුළ ප්‍රදර්ශනය කරනු ලැබේ. එම ලේඛනයේ අන්තර්ගත නම් සම්බන්ධයෙන් යම් විරෝධතාවක් පවතී නම් ඒ බව 2008.10.01 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

ඉහත ඡන්දයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරාලන හා ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ‘අ’ ආකෘති පත්‍රය යටතේ නාම යෝජනා පත්‍ර (7 වැනි නියෝගය) සම්පූර්ණ කර 2008.10.15 වැනි දිනට පෙර දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ලැබීමට සැලැස්විය යුතු වේ. ඒ සමග හෝමියෝපති වෛද්‍ය සභාවෙහි ලියාපදිංචි තහවුරු කිරීම වෙනුවෙන් ලංකා බැංකුවේ තැප්රොබේන් ශාඛාවේ ගිණුම් අංක 0002026466 දරන හෝමියෝපති අරමුදල් ගිණුමට රුපියල් 500ක මුදලක් ගෙවන ලද බව සහතික කෙරෙන පිළිගත හැකි රිසිට්පතක් අමුණා එවිය යුතුය.

මෙම ඡන්ද විමසීම තැපැල් ඡන්ද විමසීම මඟින් සිදු කිරීමට විධිවිධාන සලසා ඇති බැවින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සහ දිවයින පුරා පිහිටි සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනය කෙරෙන ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්ගේ නාම ලේඛනයෙහි සහතික කරන ලද පිටපතේ සඳහන් ලිපිනයන්හි නිරවද්‍යතාවය සහතික කර ගන්නා මෙන් සියලුම ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්හට මෙයින් දැනුම් දෙනු ලැබේ. තමාගේ ලිපිනයේ කිසියම් වෙනසක් වේ නම් ඒ බව, 2008.10.07 දින හෝ ඊට පෙර තේරීම් භාර නිලධාරියා වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතු වේ. යම් හේතුවක් නිසා එවන් ඉල්ලීම් අදාළ දිනය වන විට තේරීම් භාර නිලධාරියා වෙත නොලැබුණහොත් ලේඛනයෙහි සඳහන් ලිපිනයට ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන අතර, ඉන් පසු ඉදිරිපත් කරන කිසිදු ඉල්ලීමක් පිළිබඳ සලකා බලනු නොලැබේ. තවද මේ සම්බන්ධයෙන් වන යම් දෝෂයක් වෙතොත් ඒ පිළිබඳව අමාත්‍යාංශය විසින් වග කියනු නොලැබේ.

ඡන්දය පැවැත්වෙන දිනය සුදුසුකම්ලත් සියලුම ඡන්දදායකයන් වෙත පෞද්ගලිකව දැනුම් දීම මගින් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සහ දිනමිණ, ඩේලි නිවුස් හා තිනකරන් පුවත්පත් වල පළ කරන දැන්වීම් මඟින් ඉදිරියේ දී ප්‍රසිද්ධ කිරීමට කටයුතු සංවිධානය කර ඇති බව මෙයින් දන්වමි.

අසෝක මාලිමගේ,
ලේකම්,
දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2008ක් වූ ජූලි මස 03 වැනි දින,
පරණ කොට්ටාව පාර,
නාවින්න, මහරගම,
දුරකථන අංකය : 0112850093.

**උපලේඛනය**
***අ ආකෘති පත්‍රය***
**නාම යෝජනා පත්‍රය - (7 වැනි *නියෝගය*)**
***හෝමියෝපති සභාවට සාමාජිකයන් තෝරාපත් කර ගැනීම***

අපේක්ෂකයාගේ නම :—————.
අපේක්ෂකයාගේ නම මුලකුරු සමග :—————.
ලියාපදිංචි අංකය :—————.
අපේක්ෂකයාගේ ලිපිනය :—————.

ඉහත සඳහන් ................................... මහතා අපේක්ෂකයකු වශයෙන් නම් කිරීමට අපි අදහස් කරමු.

(1) (අ) නම :—————.
(ආ) ලියාපදිංචි අංකය :—————.
(ඇ) ලිපිනය :—————.
(ඈ) අත්සන :—————.

(2) (අ) නම :—————.
(ආ) ලියාපදිංචි අංකය :—————.
(ඇ) ලිපිනය :—————.
(ඈ) අත්සන :—————.

හෝමියෝපති සභාවට තේරී පත්වීම සඳහා නම් කරනු ලැබීමට මම එකඟ වෙමි.

අපේක්ෂකයාගේ නම :—————.

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

—————,
සාම විනිසුරු/ප්‍රාදේශීය ලේකම්.

දිනය :—————.
ස්ථානය :—————.

08-863

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**2007 වර්ෂයේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ විසිනම වැනි (29) වර්ෂයේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාවයි.

2007 වර්ෂය සඳහා ලැබුණු ආධාර ප්‍රමාණය මෙසේ ය.

| | |
|---|---|
| පුනරාවර්තන ආධාර | රු. 15,810,000.00 |
| 102-මූලධන ආධාර | රු. 200,000.00 |
| තොරතුරු තාක්ෂණ සංවර්ධන ආධාර (යූ. ජී. සී.) | රු. 1,000,000.00 |

රජයෙන් ලැබුණු ආධාර මුදල් ද ඇතුළුව මෙම වර්ෂයේ සම්පූර්ණ පුනරාවර්තන ආදායම රුපියල් දෙකෝටි තිස්නම ලක්ෂ හැත්තෑදහස් හයසිය පනස්පහ (රු. 2,39,70,655)ක් වූ අතර පුනරාවර්තන වියදම රුපියල් දෙකෝටි අටලක්ෂ දහදහස් දෙසීය හැත්තෑඅට (රු. 2,08,10,278)ක් විය. මේ අනුව පුනරාවර්තන මූල්‍ය කටයුතුවල ප්‍රතිඵලය රුපියල් තිස්එක්ලක්ෂ හැටදහස් තුන්සිය හැත්තෑ හත (රු. 31,60,377)ක අතිරික්තයකි.

මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ,
අධ්‍යක්ෂ.

2007 වර්ෂයේ වාර්ෂික ගිණුම් පිළිබඳ මූල්‍යාධිකාරිගේ වාර්තාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක 63(8) ඡේදයේ ප්‍රකාර මූල්‍යාධිකාරී විසින් කොමිෂන් සභාවේ සභාපති වෙත සැපයිය යුතු වාර්තාව**

ඉහත සඳහන් වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද මෙම ආයතනයේ ගිණුම් වාර්තාව කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන පොත්පත් හා ලේඛන අනුසාරයෙන් සකස් කරන ලද බවත් මාගේ වැටහීම හා විශ්වාසය අනුව එය සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී.

## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

### කැලණිය විශ්වවිද්‍යාලය

**2007.12.31 දිනට ශේෂ පත්‍රය**

| | 2007 රු. | 2007 රු. | 2006 රු. | 2006 රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| *ජංගම නොවන වත්කම්* | | | | |
| ලී බඩු හා සවිකිරීම් | 632,593 | | 691,747 | |
| කාර්යාල උපකරණ | 1,229,818 | | 1,603,446 | |
| රසායනාගාර හා ඉගැන්වීමේ උපකරණ | 283,784 | | 438,807 | |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 1,976,128 | | 1,811,587 | |
| රථවාහන | 40,683 | | 100,129 | |
| | | 4,163,006 | | 4,645,716 |
| **ආයෝජන** | | | | |
| පර්යේෂණ ආධාර | 74,894 | | 63,192 | |
| වෙනත් (උපලේඛන ජේ -1) | 4,196,587 | 4,271,481 | 1,608,734 | 1,671,926 |
| | | 8,434,487 | | 6,317,642 |
| **ජංගම වත්කම්** | | | | |
| ගබඩා අත්තිකාරම් (උපලේඛන කේ.) | 305,492 | | 471,288 | |
| විවිධ ණයගැතියෝ (උපලේඛන එල්.) | 29,580 | | 32,630 | |
| පර්යේෂණ හා ප්‍රකාශන තොග (උපලේඛන එල්-1) | 1,389,004 | | 1,434,125 | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් (උපලේඛන එම්.) | 3,818,158 | | 2,608,320 | |
| සේවා හා සැපයුම් අත්තිකාරකම් (උපලේඛන ඕ.) | 11,000 | | 2,540 | |
| විවිධ අත්තිකාරම් (උපලේඛන පී.) | 750 | | 750 | |
| ඉදිරි ගෙවීම් (උපලේඛන එස්) | 33,372 | | 216,213 | |
| මුදල් පොතේ ශේෂය (උපලේඛන ටී-1) | 3,715,142 | | 2,759,192 | |
| වෙනත් බැංකු ශේෂය (උපලේඛන ටී-3) | 0 | | 0 | |
| වෙනත් මුදල් ශේෂයන් (උපලේඛන ටී-4) | 2,506,750 | 11,809,248 | 845,641 | 8,370,699 |
| | | 20,243,735 | | 14,688,341 |
| **මුළු වත්කම්** | | | | |
| **වගකීම්** | | | | |
| *ජංගම වගකීම්* | | | | |
| තැන්පත් (උපලේඛන යූ.) | 44,129 | | 44,129 | |
| විවිධ ණය හිමියෝ (උපලේඛන වී.) | 9,686 | | 21,518 | |
| උපචිත වියදම් (උපලේඛන ඩබ්ලිව්.) | 411,046 | | 351,035 | |
| වෙනත් වගකීම් (උපලේඛන ඉසෙයිඩ්.) | 1,076,375 | | 282,655 | |
| අවිනිශ්චිත ගිණුම | 320 | | 320 | |
| | | 1,541,556 | | 699,657 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් (උපලේඛන බී.) | 4,416,783 | | 4,303,060 | |
| | | 4,416,783 | | 4,303,060 |
| **වගකීම් එකතුව** | | 5,958,339 | | 5,002,717 |
| **මුළු ශුද්ධ වත්කම්** | | 14,285,396 | | 9,685,624 |
| *ශුද්ධ මූලධන/වත්කම්* | | | | |
| *මූලධන ලැබීම්* | | | | |
| *පර්වර්තික සංචිත ගිණුම* | | | | |
| වැය වූ මූලධන ආධාර | 10,846,293 | | 10,186,861 | |
| වැය නොවූ මූලධන ආධාර (උපලේඛන ඒ.) | 2,966,620 | 13,812,913 | 2,426,052 | 12,612,913 |
| **සංචිත** | | | | |
| ආයතනයේ පොදු සංචිතය (උපලේඛන බී-1) | (5,115,460) | (5,115,460) | (5,351,807) | (5,351,807) |

| | 2007 | 2007 | 2006 | 2006 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **නිශ්චිත අරමුදල්** | | | | |
| පර්යේෂණ අරමුදල් (උපලේඛන ඊ.) | 15,000 | | 15,000 | |
| ත්‍යාග සහ ආධාර (උපලේඛන එෆ්.) | 1,370,894 | | 1,213,648 | |
| වෙනත් අරමුදල් (උපලේඛන ජී) | 4,202,049 | 5,587,943 | 1,195,870 | 2,424,518 |
| මුළු ශුද්ධ මූලධන/වත්කම් | | **14,285,396** | | **9,685,624** |

නිවැරදි බවට සහතික කරමු.

මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ,
අධ්‍යක්ෂ,
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

පී. බී. අබේසේකර,
ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි,
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**

කැලණිය විශ්ව විද්‍යාලය

**2007.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම**

| | 2007 | 2007 | 2006 | 2006 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | | | |
| පුනරාවර්තන වැය සඳහා රජයේ ආධාර | 15,810,000 | | 11,120,000 | |
| ණය පොලී | 114,631 | | 87,987 | |
| දේපළවලින් ලැබෙන බදු කුලී | 11,000 | | 19,000 | |
| පැරණි භාණ්ඩ වෙළඳාම | 6,950 | | 1,710 | |
| විවිධ ආදායම් (උපලේඛන 1) | 138,612 | | 180,639 | |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | 39,800 | | 340,000 | |
| පාඨමාලා ගාස්තු (පශ්චාත් උපාධි) | 7,025,003 | | 5,700,110 | |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | 235,034 | | 226,885 | |
| පුස්තකාල ගාස්තු (පශ්චාත් උපාධි) | 207,800 | | 168,500 | |
| ග්‍රන්ථ අලෙවිය | 787 | | 16,997 | |
| පුස්තකාල දඩ | 88 | | 3,180 | |
| English Through Buddhism ව්‍යාපෘති ආදායම | 22,750 | | 54,700 | |
| අවලංගු කළ චෙක්පත් | 0 | | 0 | |
| | | 23,970,655 | | 17,919,708 |
| **වියදම** | | | | |
| **පුද්ගලික වැටුප් හා වේතන** | | | | |
| පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා (උපලේඛන 02) | 7,844,564 | | 6,481,102 | |
| අධ්‍යයන සේවා (උපලේඛන 02) | 3,481,529 | | 4,083,749 | |
| *ගමන් වියදම්* | 237,835 | | 25,905 | |
| *සැපයීම්* | 675,084 | | 687,566 | |
| *අළුත්වැඩියා හා නඩත්තු වියදම්* | 228,794 | | 208,342 | |
| *ප්‍රවාහන, සන්නිවේදන හා ආවශ්‍යක සේවා* | 5,783,387 | | 5,294,995 | |
| *වෙනත් පුනරාවර්තන වියදම්* | 1,271,401 | | 827,680 | |
| *ක්ෂය කිරීම්* | 1,287,684 | | 993,954 | |
| වියදම් එකතුව | | **20,810,278** | | **18,603,293** |
| ආදායමට වැඩි වියදම ඌණතාවය ඉ/ගෙ | | | | |
| වියදමට වැඩි ආදායම අතිරික්තය ඉ/ගෙ | | **3,160,377** | | **(683,585)** |
| *අඩුකළා :* | | | | |
| ශිෂ්‍ය නිවාසවලින් පාඩුව (උපලේඛන 12) | 0 | | 0 | |
| පොදු සංචිතය ඉ/ගෙ ආ ශේෂය | (5,351,807) | (5,351,807) | (4,222,859) | (4,222,859) |
| | | **(2,191,430)** | | **(4,906,444)** |

| | 2007 රු. | 2007 රු. | 2006 රු. | 2006 රු. |
|---|---|---|---|---|
| එකතුකළා : | | | | |
| පසුගිය වර්ෂයට අදාළ ආදායම් (උපලේඛන 10) | 91,039 | | 5,860 | |
| වෙනත් බැර ගැළපීම් (උපලේඛන 11) | 140,128 | 231,167 | 457,349 | 463,209 |
| | | **(1,960,263)** | | **(4,443,235)** |
| අඩුකළා : | | | | |
| පෙර වර්ෂයට අදාළ ගෙවීම් (උපලේඛන 12) | 0 | | 201,108 | |
| ලියාහැරීම් සහ වෙනත් හර ගැළපීම් (උපලේඛන 13) | 3,155,197 | 3,155,197 | 707,464 | 908,572 |
| ශේෂපත්‍රයට ගෙන ගියා | | **(5,115,460)** | | **(5,351,807)** |

නිවැරදි බවට සහතික කරමු.

මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ,
අධ්‍යක්ෂ,
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

පී. බී. අබේසේකර,
ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි,
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

## පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය - කැලණිය විශ්ව විද්‍යාලය

**2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | 2007 රු. | 2007 රු. | 2006 රු. | 2006 රු. |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | |
| වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය) | | 3,160,377 | | (683,585) |
| **මුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයයන් සඳහා ගැළපීම්** | | | | |
| පාරිතෝෂික | | 113,723 | | 555,984 |
| ක්ෂය | | 1,135,285 | | 1,311,248 |
| | | 4,409,385 | | 1,183,647 |
| ඉකුත් කාලපරිච්ඡේදවල විෂයයන් | | (2,924,030) | | (445,363) |
| **කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | | **1,485,355** | | **738,284** |
| **කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම්** | | | | |
| ගබඩා අත්තිකාරම් සහ පර්යේෂණ හා ප්‍රකාශන | | | | |
| තොග (වැඩිවීම)/අඩුවීම | 210,917 | | 338,411 | |
| විවිධ ණයගැතියෝ (වැඩිවීම)/අඩුවීම | 3,050 | | (27,500) | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | (1,209,838) | | (598,362) | |
| සේවා සැපයීම් අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | (8,460) | | 8,498 | |
| ඉදිරි ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | 182,841 | | (190,721) | |
| වෙනත් තැන්පත් (වැඩිවීම)/අඩුවීම | (1,661,109) | | (1,560) | |
| තැන්පත් හා විවිධ ණයහිමියෝ වැඩිවීම/(අඩුවීම) | (11,832) | | 5,343 | |
| උපචිත වියදම් හා වෙනත් බැරකම් වැඩිවීම/(අඩුවීම) | 853,731 | (1,640,700) | 183,123 | (282,768) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ අගය** | | (155,345) | | 455,516 |
| **අයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (652,575) | | (2,373,557) | |
| වෙනත් ආයෝජන | (2,599,555) | | (37,790) | |
| **අයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල්** | | **(3,252,130)** | | **(2,411,347)** |

| | 2007 රු. | 2007 රු. | 2006 රු. | 2006 රු. |
|---|---|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | 1,200,000 | | 2,397,941 | |
| ත්‍යාග සහ ආධාර | 157,246 | | 333,917 | |
| වෙනත් අරමුදල් | 3,006,179 | | 506,273 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල්** | | 4,363,425 | | 3,238,131 |
| *මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශුද්ධ වැඩිවීම* | | **955,950** | | **1,282,300** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන** විෂයයන්ගේ ශේෂය | | 2,759,192 | | 1,476,892 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය (සටහන 1)** | | **3,715,142** | | **2,759,192** |

සටහන 1

| | 2007 | 2006 |
|---|---|---|
| බැංකු ශේෂය | 3,715,142 | 2,759,192 |
| වෙනත් බැංකු ශේෂ | 0 | 0 |
| | **3,715,142** | **2,759,192** |

**ගිණුම් ප්‍රතිපත්ති :**

01. **ගණකාධිකරණය මූලධර්ම**

අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම අනුගමනය කර ඇත.

02. **ක්ෂය කිරීම්**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 18 අනුව සරල මාර්ග පදනම මත ක්ෂය ප්‍රතිපාදන සලසා ඇත.

| | *ප්‍රතිශතය* |
|---|---|
| 102-ලී බඩු හා සවිකිරීම | 10% |
| 102-කාර්යාලීය ලී බඩු හා උපකරණ | 20% |
| 102-විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 20% |
| 102-පුස්තකාල පොත් සහ වාර සඟරා | 20% |
| 102-රථවාහන | 20% |

03. *තොග*

ගබඩා තොග ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 05 අනුව ගත්මිලට ආගණනය කර ඇත. ව්‍යාපාරික අරමුණක් නොමැති බැවින්, සියලු මිලදී ගැනීම් හා නිකුත් කිරීම් ගත්මිල මත ගබඩා තොග අත්තිකාරම් ගිණුමේ දක්වනු ලබන අතර එම ගිණුමේ ශේෂය මගින් අවසන් තොග නියෝජනය කෙරේ.

04. *ණයගැතියෝ*

ණයගැතියන් ලෙස දැක්වෙන්නේ කාර්ය මණ්ඩලය වෙත ගෙවනු ලබන ණය හා අත්තිකාරම් වේ. මෙම ණය හා අත්තිකාරම් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂය ඇපයට තබා ලබා දෙන බැවින්, ආපසු අයකර ගැනීමේ අවධානමක් නැත. ඒ අනුව බොල් ණය හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන සලසා නැත.

05. *ස්ථාවර වත්කම් (ජංගම නොවන වත්කම්)*

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 18 අනුව ස්ථාවර වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගය දැක්වෙන පරිදි දක්වා ඇත..

06. *පාරිතෝෂික දීමනා*

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 16 අනුව විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

අධ්‍යක්ෂ,
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2007 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2007 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(I) හා III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උපවගන්ති සම සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත.

එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2007 දෙසැම්බර් මස 31 දිනට පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 *ගිණුම්කරණ ප්‍රතිපත්ති*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සම්පූර්ණයෙන් ක්ෂය වූ එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට තොග වටිනාකම ලෙස භෞතිකව සත්‍යාපනය කල තොග වටිනාකම දැක්විය යුතු වුවත් රු. 3,05,492ක් වූ ගබඩා අත්තිකාරම් ශේෂය තොග වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

(ඇ) තොග අගය කිරීමේ දී ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන වටිනාකම්වලින් අඩු අගය සැලකිල්ලට නොගැනීම නිසා මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම රු. 2,36,792ක් වැඩියෙන් දක්වා තිබුණි.

2.2.2 *ගණකාධිකරණ අඩුපාඩු*

විගණන නියැදි පරීක්ෂණයේ දී අනාවරණය වූ එකතුව රු. 9,72,445ක් වූ ගණකාධිකරණ අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදී. එයින් රු. 3,87,484ක් වූ ගණකාධිකරණ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2008 මැයි 08 වැනි දින විගණනයට ඉදිරිපත් කෙරිණි. ඒ අනුව රු. 5,84,961ක ගණකාධිකරණ අඩුපාඩු පවත්නා අතර තවදුරටත් එවැනි අඩුපාඩු තිබීමේ ඉඩකඩ විගණනයේ දී බැහැර කළ නොහැකිය.

2.2.3 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) එකතුව රු. 9,686ක් වූ ණයහිමි ශේෂයක් වර්ෂ 06ක සිට පැවතුණි.

(ආ) 1994-1998 දක්වා කාලයට අයත් රු. 62,243ක් වූ කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් ශේෂයක් අය නොවී පැවතුණි.

2.2.4 *විගණනය සඳහා සාක්ෂි නොවීම*

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

| *ගිණුම් විෂයය* | *වටිනාකම රු.* | *නොසැපයූ ලිඛිත සාක්ෂි* |
|---|---|---|
| ලී බඩු හා සවිකිරීම් | 6,32,593 | |
| කාර්යාල උපකරණ | 13,64,812 | |
| රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ | 2,83,784 | ස්ථාවර වත්කම් ලේඛන උපලේඛන, ඉන්වෙන්ට්‍රි |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 1,976,128 | |
| රථ වාහන | 40,683 | |
| ලැබිය යුතු මුදල් | 29,580 | වයස් විශ්ලේෂණ |

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය :

| *නීති, රීති යනාදියට යොමුව* | *අනුකූල නොවීම්* |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය | 1987 සිට 2006 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා, අවසාන ගිණුම් හා විගණන වාර්තා සමග පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි |
| (ආ) 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලිය : | |
| (i) 1(10)(ඇ) වගන්තිය | ආයතනයේ අධ්‍යයන අංශ තුනෙහි ප්‍රධානීන් කළමණාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි විය යුතු වුවත් 2007 වර්ෂයේ පවත්වා තිබුණු රැස්වීම් 10ක් සඳහා සහභාගි වී තිබුණේ එක් අධ්‍යයනාංශ ප්‍රධානියකු පමණි |
| (ii) 10(2)(ආ) වගන්තිය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන් සිව් දෙනෙකු කළමණාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි කරවා ගැනීම වෙනුවට 2007 වර්ෂයේ මැයි දක්වාම කැඳවා තිබුණේ තිදෙනෙකු පමණකි |
| (iii) 13(2)(ඇ) වගන්තිය | ඒ ඒ අධ්‍යයන අංශ ආචාර්යවරු පීඨ සභා රැස්වීමට සහභාගි විය යුතු වුවත් ආයතනයේ ආචාර්යවරු කිසිවෙක් නොමැති වීම හේතුවෙන් එම අවශ්‍යතාවය සපුරා නොතිබුණි |

| *නීති, රීති යනාදියට යොමුව* | *අනුකූල නොවීම්* |
| --- | --- |
| (ඇ) රජයේ මුදල් රෙගුලාසි : | |
| (i) 133 | ආයතනයේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි |
| (ii) 1647 | වාහනයකට අදාලව ලොග් පොත් 03ක් භාවිතයට ගෙන තිබුණ ද ඒවායෙන් 2005 වර්ෂය සිට අළුත්වැඩියා විස්තර කිසිවක් සටහන් කර නොතිබුණි |
| (ඈ) 2004 ජූලි 29 වැනි දින හා අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය නොමැතිව රු. 35,27,019ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි |
| (ඉ) 2002 නොවැම්බර් මස 28 වැනි දින හා අංක 2002/අයිඒඅයි/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 01 හා 02 ඡේද | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි |
| (ඊ) 2003 ජුනි 02 දින හා අංක පීඊඩී 112 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භ කිරීමට මාස 03කට, පෙර අයවැය ලේඛනය කළමණාකරණ මණ්ඩලය වෙත අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවත් 2007 වර්ෂයේ අයවැය ලේඛනය කළමනාකරණ මණ්ඩලය අනුමත කර තිබුණේ 2007 මාර්තු 13 දින දී ය. |

2.2.6 *ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවන ගනුදෙනු*

1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීනතා දීමනා ලෙස 2007 වර්ෂය සඳහා රු. 41,040ක් ගෙවා තිබුණි.

2.2.7 *අවිධිමත් ගනුදෙනු*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

1996 වර්ෂයේ යුවාන් හෙන්ග් ජාත්‍යන්තර බෞද්ධ පදනමෙන් ගොඩනැගිලි අරමුදලකට පරිත්‍යාග වශයෙන් රු. 12,50,000ක් ලැබී තිබුණි. එහෙත් 191 වැනි කළමනාකරණ මණ්ඩල තීරණය පරිදි එම මුදල ගෙවල් කුලී අත්තිකාරම් ගෙවීමට යොදවාගෙන තිබුණි. එසේම 2001 වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහනයක් රු. 7,66,777කට විකුණා එම මුදල ද ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. අනතුරුව එම ඉතිරිකිරීමේ ගිණුමේ මුදල හා පොලිය ද, ආයතනයේ මුදල් ද යොදවා රු. 29,00,000ක ගොඩනැගිලි අරමුදලක් හා රු. 2,00,000ක වාහන අරමුදලක් 2007 වර්ෂයේ දී ඇතිකර තිබුණි. මෙම අරමුදල මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව 2007 වර්ෂයේ දී ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. මේ නිසා ආයතනය ගොඩනැගිලි අරමුදල 2001 වර්ෂයේ දී ගෙවල් කුලී ගෙවීම සඳහා වැය කර ඇතත් පොදු සංචිතය උපයෝගි කරගෙන නැවත ගොඩනැගිලි අරමුදල ඇතිකර තිබුණු බව අනාවරණය විය.

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2007 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 1,26,49,623ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු. 1,18,03,586ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 1,58,10,000ක ප්‍රදානය හේතුකොට ගෙන සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 31,60,377ක අතිරික්තයක් බවට පත් විය. ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 1,11,20,000ක ප්‍රදානය හේතුකොටගෙන එම වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 6,83,585ක් දක්වා අඩු විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කාර්ය සාධනය

(අ) අධ්‍යයන කටයුතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(i) ආයතනය විසින් පාඨමාලා 06ක් පවත්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 386ක් වූ අතර, පසුගිය වර්ෂයට සාපේක්ෂව ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 97කින් වැඩි වී තිබුණි.

(iii) ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා අධ්‍යයන අංශ 03ක් පවත්වා තිබුණු අතර ආයතනයේ අධ්‍යක්ෂවරයා හා තවත් කොන්ත්‍රාත් පදනම මත යොදවා ගත් කථිකාචාර්යවරයෙකු දේශන කටයුතු වල නියැලී තිබුණි.

(iv) බාහිර කථිකාචාර්යවරු 12 දෙනෙකුට දේශන පැවැත්වීම වෙනුවෙන් රු. 759,480ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි.

(ආ) විභාග ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශාස්ත්‍රපති සිංහල විභාගයට සිසුන් 145ක් සුදුසුකම් ලබා සිටි අතර එයින් විභාගයට පෙනී සිටි සංඛ්‍යාව 123කි. විභාගය සමත් සංඛ්‍යාව 108ක් වූ අතර අසමත් වීමේ ප්‍රතිශතය විභාගයට පෙනී සිටි සංඛ්‍යාවෙන් 12%කි.

(ii) ශාස්ත්‍රපති ඉංග්‍රීසි මාධ්‍ය විභාගයට සුදුසුකම් ලැබූ සිසුන් 84කින් විභාගයට පෙනී සිටි සංඛ්‍යාව 76කි. සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 61කි. අසමත් ප්‍රතිශතය විභාගයට පෙනී සිටි සංඛ්‍යාවෙන් 19%කි.

(ඇ) ඒක ශිෂ්‍ය පිරිවැය

ආයතනයේ අධ්‍යයන, පරිපාලන, මූල්‍ය හා වෙනත් වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැය කල මුළු මුදල රු. 20,673,221ක් විය. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු වල නිරත වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 446ක් වූයෙන් වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු. 46,352ක් විය.

3.2.2 කාර්ය මණ්ඩල පිරිවැය

ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් 22ක් වර්ෂය තුළ සේවයේ යොදවා තිබුණි. වර්ෂය තුළ දරා ඇති කාර්ය මණ්ඩල වැටුප් පිරිවැය රු. 10,566,603ක් වූයෙන් වාර්ෂික ඒක සේවක සාමාන්‍ය පිරිවැය රු. 480,300ක් විය.

3.2.3 මූලධන ප්‍රතිපාදන ඌන උපයෝජනය

පරිගණක සඳහා වැය නොවූ මුලධන ප්‍රදාන ගිණුමේ 2006 දෙසැම්බර් මස 31 දිනට ශේෂය රු. 999,683ක් වූ අතර පරිගණක හා තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සඳහා 2007 වර්ෂයේ දී රු. 1,000,000ක් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණි. ඒ අනුව රු. 1,999,683ක් වූ ප්‍රතිපාදන තිබියදීත් 2007 දෙසැම්බර් මස 31 වැනි දින වන විටත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආචාර්යවරුන් විසින් රචිත ග්‍රන්ථ හා පරිවර්තන ආයතනය විසින් මුද්‍රණය කිරීමේදී පිටපත් අධික ප්‍රමාණයක් මුද්‍රණය කිරීම හේතුවෙන් හෝ අලෙවි කිරීමට විධිමත් ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් 2007 දෙසැම්බර් මස 31 වැනි දිනට ගබඩාවෙහි වටිනාකම රු. 1,389,004ක් වූ පොත් 4656ක් විය. තවද 30 වන සංවත්සරය හේතුවෙන් මුද්‍රණය කරන ලද පොත් 1030ක ශේෂයක් ද ඉතිරිව පැවතුණි.

(ආ) නාරාහේන්පිට පිහිටි කුලී ගොඩනැගිල්ලක ආයතනය පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 21,580,000ක කුලියක් ගෙවා තිබුණි. එහි පළමු මහලේ වර්ග අඩි 4176ක් වූ ප්‍රමාණයක් කාමර 14කට වෙන් කර තිබුණු අතර එහි වැසිකිළි සහිත නාන කාමර 14ක් ද විය. මෙම ඉඩ පහසුකම් කාර්ය මණ්ඩලයේ මුළු නිලධාරීන් 20 දෙනෙකුගේ පරිහරණය සඳහා යොදාගෙන තිබුණි. තවද පලමු මහලේ ආපන ශාලාවක් හා කෑම කාමරයක් සඳහා ඉඩකඩ වෙන් කර තිබුණ ද එය ද භාවිතයට ගෙන නොතිබුණි. මේ අනුව සමස්ත ඉඩකඩ ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් ඌන උපයෝජිත මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය.

3.2.5 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1989 ජූනි 16 දින හා අංක පීඑෆ්ඩී 52 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව 2007 වර්ෂය ආවරණය වන පරදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2003 ජූනි මස 02 වැනි දින හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය අනුව 2002 සිට 2006 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කළ සංයුක්ත සැලැස්මේ ඉලක්ක සපුරා නොතිබුණි.

(ඇ) 2007 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් පිළියෙල කළ යුතු සංයුක්ත සැලැස්ම 2006 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුව ද එසේ කටයුතු කර නොතිබුණි.

3.2.6 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය වුණි.

**4. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂ වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) පාඨමාලා පැවැත්වීම
(ආ) වාහන උපයෝජනය
(ඇ) තොග හා ගබඩා
(ඈ) වත්කම්

එස්. ස්වර්ණජෝති,
විගණකාධිපති.

08-794

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

එන් (පීවීඑස්)35209.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සෙටානා සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2003.09.25 දින සංස්ථාපිත සමාගමක් වන සෙටානා සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සෙටානා සිලෝන්' (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 31 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-712

එන් (පීවීඑස්)36769.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "එග්මොන්ට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.02.27 දින සංස්ථාපිත සමාගමක් වන එග්මොන්ට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, එග්මොන්ට් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 31 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-713

එන් (පීවීඑස්)38897.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "එක්ස්සෙලන්ට් මැනුෆැක්චර්ස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට් ලිමිටඩ්)" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.09.08 දින සංස්ථාපිත සමාගමක් වන එක්ස්සෙලන්ට් මැනුෆැක්චර්ස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, එක්ස්සෙලන්ට් මැනුෆැක්චර්ස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 31 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-714

---

එන් (පීවීඑස්)37743.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සිනර්ජි සිස්ටම් සොලියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.06.03 දින සංස්ථාපිත සමාගමක් වන සිනර්ජි සිස්ටම් සොලියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සිනර්ජි සිස්ටම් සොලියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 31 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-711

එන් (පීවීඑස්)8940.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ෆීනික්ස් පෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1992.03.20 දින සංස්ථාපිත සමාගමක් වන ෆීනික්ස් පෙට් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ෆීනික්ස් පෙට් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 31 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-710

---

පීවීඑස්7117.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සූත්හාසි ඒජන්සීස් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1980.12.15 දින සංස්ථාපිත සමාගමක් වන සූත්හාසි ඒජන්සීස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සූත්හාසි ඒජන්සීස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 31 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-709

එන් (පීවීඑස්)31318.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ප්ලොඩ් සෙකියුරිටි සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2002.08.15 දින සංස්ථාපිත සමාගමක් වන ෆ්ප්ලොඩ් සෙකියුරිටි සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ෆ්ප්ලොඩ් සෙකියුරිටි (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටි ආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 31 දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

08-715

---

**මහජන බැංකුව - මරදගහමුල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.23 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2006.06.23 දිනැති අංක 11304 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වැඩඩ මුදියන්සේලාගේ අනුර ප්‍රියන්ත යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ හැටහයදහස් හාරසියය (රු.466,400) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2006.10.27 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් හාරලක්ෂ හැටහය දහස් හාරසියය (රු.466,400) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ හැටහයදහස් හාරසියය (රු.466,400) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 11304 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරනය කරයි.

**උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, උතුරු අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ (දිවුලපිටිය උපකාර්යාල සීමාවේ) මාපලන්ගෙදර ග්‍රාමයේ පිහිටි මිල්ලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. විතාරණ විසින් 2006.01.04 වැනි දින මැන සකස් කල අංක 5121 දරන පිඹුර පරිදි මායිම් උතුරට : ඇල සහ පාර කොටස ද, නැගෙනහිරට : පාර, බී කොටස සහ බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සකස් කරන ලද අංක 1246 පිඹුරේ සඳහන් ලොට් ඩී ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සකස් කරන ලද අංක 1246 පිඹුරේ සඳහන් ලොට් ඩී සහ දැනට එස්. රත්නසිරි පෙරේරා හිමිකම් කියන අංක 1246 පිඹුරෙහි කැබලි අංක සී2 සහ එස්. ජයන්ත පෙරේරා හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : එකී අංක 1246 පිඹුරේ සඳහන් එස්. රත්නසිරි පෙරේරා හිමිකම් කියන ලොට් සී 2 ඉඩම සහ ඇල ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් විසිඅටයි දශම හතයි බින්දුව (අක්කර 0, පර්චස් 28.70) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ787/284 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් 1998.10.19 දින සකස් කරන ලද අංක 269 පිඹුරේ සඳහන් ලොට් බී දරන කොටස පාරක් සඳහා පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-723

---

**මහජන බැංකුව - යක්කල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.04.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2003.01.13 දිනැති අංක 7711 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, කුරුප්පු අප්පුහාමිලාගේ චමිලා ඉන්දීවරී සිසිකුමාරි කුරුප්පු හා කුරුප්පු අප්පුහාමිලාගේ ජයම්පති සිරිනාග කුරුප්පු යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හැත්තෑහයදහස් හාරසිය විසිනමයයි ශත හැටතුන (රු.3,76,429.63) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2004.08.28

දින සිට වර්ෂයකට 22.5% බැගින් රුපියල් තුන්ලක්ෂ හැත්තෑහයදහස් හාරසිය විසිනමයයි ශත හැටතුන (රු.3,76,429.63) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හැත්තෑහයදහස් හාරසිය විසිනමයයි ශතහැටතුන (රු. 3,76,429.63) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 7711 දරන උකසක්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැදපත්තුවේ, අලුත්ගම, මහවිට පිහිටි දංගොල්ලේකුඹුර නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් 2002.10.28 වැනි දින මැන සකස් කල අංක 2252 දරන පිඹුරේ ලොට් අංක 5බී දරන කොටසට මායිම් උතුරට : පිඹුරු අංක 2072 හි ලොට් 5 හි ඉතිරි කොටස හා පාර ද, නැගෙනහිරට : නුවර පාර ද, දකුණට : මගේ පිඹුරු අංක 1286 ලොට් 1 ද, බස්නාහිරට : පිඹුරු අංක 2072 හි ලොට් 5 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අක්කර 0, රූඩ් 0, පර්චස් 20) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ592/158 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිරි III කළාප කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-724

---

### මහජන බැංකුව - කොට්ටාව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.06.27 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද අංක 2804 සහ 2007.08.20 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම හෙයියන්තුඩුවගේ සුමනදාස පෙරේරා මහතා, ලලිතා අයිරාංගනී දිසානායක හෙවත් ලලිතා අයිරාණි දිසානායක මහත්මිය සහ හෙයියන්තුඩුවගේ රසික නාමල් සුලලිත යන අය විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2804 දරන බැඳුම්කරය මත රුපියල් පන්ලක්ෂ අසූහත් දහස් පන්සීයයක (රු. 5,87,500) මුදලක් සහ රුපියක් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1962 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් පන්ලක්ෂ අසූහත් දහස් පන්සීයයක (රු. 5,87,500) මුදල සහ රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදල 2008.01.21 වැනි දින සිට සහ 2007.10.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට විසිපහ (25%) බැගින් තවදුරටත් පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අය කර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 2804 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපල සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමා (වැතර උප කාර්යාලය) ඇතුළත සිද්දමුල්ලේ පිහිටියා වූ "හෙදවකගහවත්ත" සහ "පුවක්ගහදෙනිය" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එන්. පී. ඇල්විටිගල විසින් සාදන ලද අංක 2681 හා 2006 මාර්තු 28 දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : අංක 984 දරන පිඹුරේ ලොට් අංක 03 ද, නැගෙනහිරට : අංක 984 පිඹුරේ ලොට් අංක 2, හා 5 ද, දකුණට : අංක 984 පිඹුරේ ලොට් අංක 6 ද, බස්නාහිරට : දහම් මාවත ද, මායිම් වන්නා වූ ද එකී අංක 2681 දරන පිඹුරට අනුව පර්චස් දහඅටයි දශම හතයි බිංදුවක් (අක්. 0, රූඩ් 0, පර්. 18.70) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත්ය.

ඉහත කී සිද්දමුල්ල පිහිටියා වූ ද "හෙදවකගහවත්ත" සහ "පුවක්ගහදෙනිය" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද අංක 984 සහ 1962.10.24 දින දරන පිඹුරේ ලොට් අංක 4 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද උතුරට : ලොට් අංක 03 ද, නැගෙනහිරට : ලොට් අංක 2හා 5 ද, දකුණට : ලොට් අංක 6 ද, බස්නාහිරට : පාර ද මායිම් වන්නා වූ ද එකී අංක 984 දරන පිඹුරට අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N227/90 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II)

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

08-722

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001912.

ණයකරුගේ සම්පූර්ණ නම : කොට්ටල් බැද්දේ විදානෙලාගේ කල්‍යාන දීප්ත කුමාර සහ කොට්ටල් බැද්දේ විදානෙලාගේ ආරියසේන.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. රුහුණුහේවා විසින් ලියා සහතික කරන ලද 2975 හා 2006.09.19 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දහහතර ලක්ෂ හැටපන්දහස් පන්සිය අසූ පහයි ශත අටක (රු. 14,65,585.08) මුදලක් වර්ෂ 2008.02.29 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දහතුන් ලක්ෂ අසූපන් දහස් තුන්සිය හැට තුනයි ශත අසූවක (රු. 13,85,363.80) මුදල ද වර්ෂ 2008.02.29 වන දින දක්වා පොළියවශයෙන් රුපියල් අසූ දහස් දෙසීය විසි එකයි ශත විසි අටක් (රු. 80,221.28) ද, වශයෙන් සම්පූර්ණ කොට රුපියල් දහහතර ලක්ෂ හැටපන්දහස් පන්සිය අසූ පහයි ශත අටක (රු. 14,65,585.08)

(2) එකී රුපියල් දහතුන් ලක්ෂ අසූපන් දහස් තුන්සිය හැට තුනයි ශත අසූවක (රු.13,85,363.80) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.9% බැගින් වන පොළියක් 2008.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තුද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස්බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ මාර්තු මස 28 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ 3 වන කොටස කුරන මීගමුව මහ නගර සභා සීමාවේ වරිපනම් අංක 769/3, කොළඹ පාරේ හි පිහිටි තල්ගහවත්ත නොහොත් බක්මීගහවත්ත නමැති ඉඩමට පී. ඩී. එන්. පීරිස් මානක තැන විසින් 2004.09.03 දින සම්පාදිත අංක 2177 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : ආරියදාසට අයිති ඉඩම සහ පිඹුරු අංක 2153 හි කැබලි අංක A ද, නැගෙනහිරට : පාර සහ ක්‍රිස්ටි ජයමාන්නට අයිති ඉඩම ද, දකුණට : රාජක්‍රිෂ්ණ සහ අනිත් අයට අයිති ඉඩම් ද, බටහිරට: මීගමුව පාර සහ පිඹුරු අංක 2153 හි කැබලි අංක A1 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහඅටයි දශම හතයි පහක (අක්. 0, රූඩ්. 0, පර්. 18.75) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවයද සමග වේ. මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A279/236 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

08-773

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2008.06.04 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2006.12.12 වෙනි දිනැති අංක 5437 දරන උකස්කරය මත මුල් මුදල් හා 2007.10.31 වෙනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් එක් කෝටි අට ලක්ෂ එක්දහස් එකසිය පනස් දෙකයි ශත නමයක (රු. 1,08,01,152.09) මුදල සමග රුපියල් අනූ අට ලක්ෂ පනස් දෙදහස් දෙසීය හැත්තෑ නමයයි ශත පනස් හතක (රු. 98,52,279.57) මුදල මත 2007.11.01 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසි හතරයි දශම පහයි බින්දුවක (24.50%) වැඩිදුර වාර්ෂික පොළියක් ද, මහනුවර, පේරාදෙණිය පාර, අංක 164 හි සීමාසහිත ටෙලි පික්ස් ටෙක්නොලෙජීස් (පුද්) වෙතින් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2006.12.12 දිනැති අංක 5437 දරන උකස්කරය මත අයවිය යුතු රුපියල් එක් කෝටි අටලක්ෂ එක්දහස් එකසිය පනස් දෙකයි ශත නමයක (රු.1,08,01,152.09)මුදල සමග 2007.11.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වෙනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ ද මෙම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම මහනුවර ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකරු විසින් ප්‍රසිද්ධ කිරීමට එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ, කටුකැලේ, පේරාදෙනිය පාර, දැනට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත හි පිහිටි, පෙර වරිපනම් අංක 102/103 ලෙස ද, වත්මන් වරිපනම් අංක 167/1, 167 හා 169 දරන 'දෙයියන්වල' යයි හඳුන්වනු ලබන, උතුරට : පේරාදෙනිය පාර, දැනට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ද, නැගෙනහිරට : අන්දිරි වරකාඋල්ල පුංචිබණ්ඩා ගේ දේපල ද, දකුණට : රජයේ ඉඩම ද, බස්නාහිරට : අන්දිරිස් හේනයා ගේ දේපල ද මායිම් වූ පර්චස් නවයයි දශම එකක (අ. 0, රූ. 0, පර්. 9.1) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටස සියල්ල හා එහි තුළ පිහිටා ඇති ගොඩනැගිලි, පස්, ගස්, වැවිලි හා සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 375/123 දරන පිටුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම හා ස්ථානය මනින ලදුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ, කටුකැලේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. එම්. එච්. නවරත්න මයා විසින් සාදන ලද 1988 ඔක්තෝම්බර් මස 30 වෙනි දිනැති අංක 51 82 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති සිරිමාවෝ බණ්ඩාරනායක මාවත අංක : 167 හා 169 යනුවෙන් විස්තර කරනු ලබන, ඊශාන දෙසට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, අංක 165 දරන ස්ථානය ද, ගිණිකොණ දෙසට : රජයේ ඉඩම ද, (මහනුවර ගුඩ්ෂෙඩ් බස් නැවතුම් පළ) නිරිත දෙසට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත අංක 171 දරන ස්ථානය ද, වයඹ දෙසට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ද මායිම් වූ, පර්චස් දහයක (අක්. 0, රූ. 0, පර්. 10) ප්‍රමාණයෙන් යුත්, එහි තුළ පිහිටා ඇති වරිපනම් අංක : 167 හා 169 දරන ගොඩනැගිලි සමග වූ, බෙදා වෙන් කරන ලද ඉඩම හා ස්ථානය වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. යූ. බණ්ඩාර මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

08-789

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කිරුළපන ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය.

2008 ක් වූ ජූලි මස 07 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහිතක කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද 2006.12.21 දින හා අංක 2012 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම නලින් මහින්ද ෂලීලා මුණසිංහ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කර යටතේ රුපියල් හතලිස්හත්ලක්ෂ තිස්නමදහස් පන්සිය හැත්තෑඅටයි ශත හැට (රු.4,739,578.60) ක මුදලක් 2008.04.10 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 4,739,578.60 ක මුදලට 2008.04.11 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 2012 දරන උකස් බැදුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාව තුළ ඇතුල් කෝට්ටේ, පිහිටි ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවතේ වරිපනම් අංක 941/12බී හි "අදිකාරන්ගේ වත්ත" සහ "අදිකාරම්ගේ වත්ත" දරන ඉඩමට බලයලත් මානක පී. සින්නතම්බි විසින් මැන සාදන ලද 1997.05.15 දිනැති අංක 5962 දරන පිඹුරේ ලොට් 31 ලෙස සලකුණු කරන ලද ඉඩම් කොටසට උතුරට : කෝට්ටේ පාරේ, වරිපනම් අංක 941/12 වන පිඹුරු අංක 1311 හි ලොට් අංක 32 දරන කොටසින් ද නැගෙනහිරට : (ලොට් අංක එෆ් මීටර් 601 දිග පාර (අඩි 20 පළල) 6 වන පටුමගෙන් ද දකුණට : කෝට්ටේ පාරේ, වරිපනම් අංක 909/11 වන පිඹුරු අංක 1311 හි ලොට් අංක 30 දරන කොටසින් ද සහ බස්නාහිරට : (ලොට් ජී කොටස වන මීටර් 601 දිග පාර (අඩි 20 පලල) අදිකාර මාවතෙන් ද මායිම් වූ පර්චස් විස්සයි දශම හතරයි බිංදුව (අ. 0, රූ.0 පර්. 20.40) ක් විශාල ඉඩම සහ සියළුදේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2918/32 යටතේ ලියාපදිංචි වී ඇත.

අංක 2012 දරන උකස් බැදුම්කරයේ දෙවන උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

08-770

---

### සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර

ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. එන්. කේ. ඉලංගන්තිලක විසින් ලියා සහතික කරන ලද අංක 726 හා 2006.01.16 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් පූජාපිටියේ, රත්නායක මුදියන්සේලාගේ නාමල් අබේකෝන් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 අප්‍රියෙල් 30 දිනට ඉහත කී අංක 726 දරන උකස් බැඳුම්කරය මත එකී රත්නායක මුදියන්සේලාගේ නාමල් අබේකෝන් යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් තුන්ලක්ෂ විසිතුන්දහස් පන්සිය හතකුත් ශත හැත්තෑ හතක (රු.3,23,505.77) ක මුදලක් සහ 2008 මැයි 01 දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ එම ණය පහසු කමට අදාළ වෙනත් යම් අනුපාතිකයක් මත පොළියද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තුන්ලක්ෂ විසිතුන් දහස් පන්සිය පහකුත් ශත හැත්තෑ හතක (රු.3,23,505.77) මුදලක් සහ 2008 මැයි මස 01 වන දින සිට විකිණීමේ දින දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ එම ණය පහසුකමට අදාළ වෙනත් යම් අනුපාතිකයක් මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 726 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියළු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම යන මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 726 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පල්ලේ ගම්පහ පත්තුවේ, හාරිස්පත්තුවේ, ඔව්ස්සගම පිහිටි වටපුලුවදෙනිය නොහොත් පනික්කි අච්චියාගේ තැන්නෙ වත්ත පනික්කි අච්චියාගේ තැන්නෙ දෙණිය සහ වත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. ටී. යූ. විජේසිංහ විසින් මැන සාදන ලද අංක 348 හා 1997.03.06 දින දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : වැටිය (Ridge) අප්පුහාමිගෙ දැනට ගෙගන්ගිලත් වත්ත ඒ. එම්. ඩිංගිරි බණ්ඩා සහ තවත් අය හිමිකම් කියන ද, නැගෙනහිරට : අංක 348 දරන පිඹුරේ ලොට් අංක 2 ද, දකුණට : අංක 348 දරන පිඹුරේ ලොට් අංක 3 ද බස්නාහිරට: මහපාර ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් දහයයි දශම අටක් (අ. 0, රූ. 1, පර්. 10.80) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි සහ ඊට අනුබද්ධ වෙනත් සියලු දේ.

ඉහත කී ඔව්ස්සගම පිහිටි, පනික්කි අච්චියාගෙ තැන්නෙ දෙණිය නොහොත් කුඹුර, පනික්කි අච්චියාගෙ තැන්නෙ දෙණිය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එම්. ටී. යූ. විජේසිංහ විසින් මැන සාදන ලද අංක 348 හා 1997.03.06 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 02 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට ඇළද නැගෙනහිරට : ඇළ ද, දකුණට : අංක 348 දරන පිඹුරේ ලොට් අංක 04 කොටසක් ද, බස්නාහිරට : අංක 348 දරන පිඹුරේ ලොට් අංක 1, 3 සහ 5 ද යන මායිම් ඇතුළත් පර්චස් තිස්තුනයි දශම හයයි අටක් (අ. 0, රූ. 0, පර්. 33.68) නැතහොත් (හෙ. 0.08519) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි හා ඊට අනුබද්ධ සියලු දේ.

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

08-768/1

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය.

ණය අංකය : 0230001928.
ණයකරුගේ සම්පූර්ණ නම : පොන්නිය කාලයි සෙල්වම්.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. නිරිඇල්ල විසින් ලියා සහිතක කරන ලද 2786 හා 2007.01.31 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දහහතර ලක්ෂ හතළිස් පන් දහස් තුන්සිය තිස් එකයි ශත දොළහක (රු. 1,445,331.12) මුදලක් වර්ෂ 2008.02.29 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දහතුන් ලක්ෂ හතළිස් අට දහස් එකසිය පනස් හතරයි ශත අටක (රු.1,348,154.08) මුදල ද, වර්ෂ 2008.02.29 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් අනූහත් දහස් එකසිය හැත්තෑහතයි ශත හතරක් (රු.97,177.04) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දහහතර ලක්ෂ හතළිස් පන් දහස් තුන්සිය තිස් එකයි ශත දොළහක් (රු.1,445,331.12) ද,

(2) එකී රුපියල් දහතුන් ලක්ෂ හතළිස් අට දහස් එකසිය පනස් හතරයි ශත අටක (රුත 1,348,154.08) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොළියක් 2008.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද, යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස

සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ මාර්තු මස 28 වැනි පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ දලුපොත ග්‍රාමයෙහි පිහිටි බන්ධනාගාර කඳවුර පාරේ වරිපනම් අංක 136/16 හි පිහිටි පල්ලන්චේන වත්ත නමැති ඉඩමට 2006.10.14 දින ඩී. පී. විමලසේන මානක තැන විසින් මැන සම්පාදිත අංක 6065 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරට: පිඹුරු අංක 587 හි කැබලි අංක 43Aද, නැගෙනහිරට : බෙස්ලයින් පාර ද, දකුණට : අඩි 20 ක් පළල පාර (පිඹුරු අංක 1558 හි කැබලි අංක 10R) ද, බටහිරට : එස්. ප්‍රනාන්දුට අයත් ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවහයි දශම හයයි එකක (අ. 0, රූඩ් 0, පර්. 15.61) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද, මාර්ග පරවශතාවයද, සමඟ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 941/256 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

08-774

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනු ලැබූ යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ ජුනි මස 19 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී, මින් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (බැංකුව) නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් රුවනි රාජපක්ෂ (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2004.12.14 වැනි දින අංක 68 දරන බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. එස්. ඉලංගකෝන් (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2006.08.31 වැනි දින අංක 4708 දරන පැවරීමේ ඔප්පුව යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, අලව්ව දරන ස්ථානයේ පදිංචි අතුල බෝපාගොඩ හෙට්ටිගේ සහ විතාන අච්චිලාගේ අශෝකා හේමමාලි ගුණසේකර (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තවද වර්ෂ 2008 ක් වූ මැයි මස 31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් හාර ලක්ෂ විසි දෙදහස් විසි අට (රු.4,22,028) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද, 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හාර ලක්ෂ විසි දෙදහස් විසි අට (රු.4,22,028) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2008 ක් වූ ජුනි මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් හාර ලක්ෂ දාහත් දහස් පන්සිය අසූ හය (රු.4,17,586) ක මුදලක් මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වැනි වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපළ සහ පරිශ්‍රය ඇතුළුව සහ එහි නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

